# ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත  පුද්ගලයන් සවිබලගැන්වීම සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ කාර්යසාධනය





# ජාතික විගණන කාර්යාලය

## පටුන


| ඡේද අංකය | | පිටු අංකය |
|---|---|---|
| **1.** | විධායක සාරාංශය | **3** |
| **2.** | හැඳින්වීම | |
| **2.1** | සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ කාර්ය භාරය | **6** |
| **2.2** | විගණනය සඳහා මාතෘකාව තෝරා | **10** |
| **2.3** | විගණන අරමුණු | **10** |
| **2.4** | විගණන විෂය පථය | **12** |
| **2.5** | සම්බන්ධිත ආයතන හා කාර්ය භාරයන් | **12** |
| **2.6** | විගණනය සඳහා අධිකාරි බලය | **14** |
| **2.7** | විගණන ප්‍රවේශය | **14** |
| **2.8** | විගණන නිර්නායක | **14** |
| **3.** | විස්තරාත්මක විගණන ක්ෂේත්‍ර | |
| **3.1** | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන් අවශ්‍ය පරිසරය ගොඩනැගීම | **15** |
| **3.2** | ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ක්‍රියාත්මක විවිධ වැඩසටහන් | **17** |
| **3.3** | විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩ සටහන්වල කාර්යසාධන මට්ටම | **28** |
| **4** | නිර්දේශ | **30** |
| **5** | ඇමුණුම් | **32** |

# 1. විධායක සාරාංශය

ලෝකයේ ජීවත්වන සියළුම මානවයන් ආත්ම අභිමානයෙන් යුතුව ජීවත්වීමට අපේක්ෂා කරයි. එම තත්ත්වය සලසාදීම සඳහා අවශ්‍ය නීතිරීති සම්පාදනය කර අගතියට පත් තැනැත්තන්වේ නම් ඔවුනට සමානත්වය ලබාදී සමාජය සමතුලිතතාවයට පත් කර ගැනීමට රජයන් කටයුතු කරනු ලැබේ. ඒ අනුව සමාජය තුල ජීවත්වන විවිධ ශාරිරික සහ මානසික අපහසුතාවලින් පිඩා විඳින ජනතාව වෙනුවෙන් රජය සහන සලසනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, අභිසංවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සහ ඊට අනුෂාංගින කරුණු සඳහා විධිවිධාන සැළැස්වීමට **1996** අංක **38** දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සම්මත කර ගෙන තිබුණි.

මෙම පනතේ සඳහන් කාර්ය භාරයන් යටතේ ආබාධ සහිත පුද්ගලයින්ද සමාජයේ පුරවැසියන් අතර සමානත්මතාවයෙන් ජීවත් කරලීමට අවශ්‍ය පසුබිම සකස් කරදීමට බැඳි සිටී. ඒ අනුව අඩු ආදායම් මට්ටමක ජීවත්වන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට නිවාස ඉදිකිරීමට ආධාර ලබාදීම, ආධාරක උපකරණ ලබාදීම, මාසිකව දීමනාවක් ලබාදීම, ස්වයං රැකියා කරගෙනයාමට ආධාර සැපයීම, වෛද්‍ය ආධාර ලබාදීම, අධ්‍යාපන ආධාර ලබාදීම සහ වයස අවුරුදු **16** සිට **35** දක්වාවූ ආබාධ සහිත පුද්ගලයන්ට නේවාසිකව වෘත්තීය පුහුණු පාඨමාලාවල නිරතවීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන කර්තව්‍යයන් සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ආබාධිත තැනැත්තන් සඳහාවූ ජාතික මහ ලේකම් කාර්යාලය සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලැබේ.

මෙම විගණන වාර්තාව සකස් කිරීමේ අරමුණ වනුයේ වාර්ෂිකව රජය විසින් ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයට සහ සමාජ සේවා දෙපාර්තමේන්තුවට ලබාදෙන ප්‍රතිපාදන මගින් ආබාධිත පුද්ගලයන්ට ලබාදෙන ආධාර සහ පහසුකම්වලින් එම පුද්ගලයන් සමාජය තුල සවිබලගැන්වීම කෙතෙක් දුරට සිදුවන්නේද යන්න ඇගයීමයි. මෙම විගණනය මගින්, ශ්‍රී ලංකාවේ අඩු ආදායම් ලබන ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව දත්ත පද්ධතියක් මෙතෙක් පවත්වාගෙන නොතිබීම, ඒ හේතුවෙන් ආධාර ලබාදීමේ ක්‍රමවත් සැළසුමක් සකස්කර නොතිබීම, ආබාධ සහිත පුද්ගලයන්ට ලබාදිය යුතු ආධාරක උපකරණ ජංගම සේවා මගින් ලබාදීම නිසා සාධාරණ ලෙස එම උපකරණ නොලැබී යාම, නිවාස ආධාර ලබාදීම වර්ෂ ගණනාවක් ප්‍රමාද තත්ත්වයක පැවතීම හේතුවෙන් නිවාස ඉදිකිරීම අතරමග නතරවී තිබීම, ස්වයං රැකියා අධාර ලබාදීමත් සමඟ වෘත්තීය පුහුණුව ලබා නොදීම හේතුවෙන් එම රැකියා අතරමඟ නතර කර දැමීම,

ශ්‍රවණ ආබාධ සහිත පුද්ගලයන්ට තම අවශ්‍යතාවයන් ඉදිරිපත් කිරීමේදී නිවැරදි තොරතුර සන්නිවේදනය කිරීමට සංඥා භාෂාව පුහුණුකළ නිළධාරීන්ගේ හිඟකම, ප්‍රවේශ පහසුකම් පිළිබඳව අවධානය යොමු කිරීම අවම තත්ත්වයක පැවතීම, අධ්‍යාපන ආධාර ලබාදීම සම්බන්ධව පාසැල් දැනුවත්කිරීම් අවමවීම ආදි අඩුපාඩුකම් ද නිරීක්ෂණය විය.

ආබාධ සහිත පුද්ගලයන් හඳුනා ගැනීම සහ එම පුද්ගලයන්ට සහන සැළසීම යන මූලික කරුණු දෙක ඉටුකර ගැනීමට සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට එක් සමාජසේවා නිලධාරියකු බැගින් අනුයුක්ත කර ඇත. දිවයින පුරා දිස්ත්‍රික්ක 25 තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ක් පවතින අතර මෙම කාර්යය ඉටුකිරීමේදී මෙම නිලධාරින් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණදෙන අතරම ඔවුන්ගේ කාර්යයන් පසුවිපරම් කිරීමද බෙහෝදුරට මගහැරී තිබීම, 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම යටතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන්ද මෙතෙක් නිසි පියවරයන් ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 2. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ නෛතික විග්‍රහය ආබාධ ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම පිළිබඳ පනතේ දක්වා ඇති ආකාරය පහත පරිදි වේ. ‘‘ආබාධ ඇති තැනැත්තකු යන්නෙන් සහජයෙන්ම ඇති වූ, එසේ නොවූ ශාරිරික මෙන්ම මානසික හැකියාවන්හි යම් ඌනතාවයක ප්‍රතිඵලයක් වශයෙන් ජිවිතයේ අවශ්‍යතාවයන් මුළුමනින් හෝ කොටස් වශයෙන් හෝ තමා විසින්ම තමා සඳහාම ඉටුකර ගැනීමට නොහැකි යම් තැනැත්තෙකු’’අදහස් වේ.

සියළු මිනිසුන් නිදහස්ව උපත ලබන අතර, අභිමානය හා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමාන වෙති. ඔවුහු තර්කය හා හෘදය සාක්ෂිය උරුමව සිටින අතර සහෝදරත්ව ජීව ගුණය යුතුව එකිනෙකා කෙරෙහි පැවතිය විය යුතුයැයි 1948 දෙසැම්බර් මස 10 දින මානව හිමිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනය විසින් දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රජාව තුළ ආබාධිත තැනැත්තන් ආරක්ෂා කර ගැනීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති අතර, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යංශය යටතේ පවතින ආබාධිත සහිත තැනැත්තන් සඳහාවූ ජාතික මහ ලේකම් කාර්යාලය සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව මෙය ක්‍රියාත්මක කිරීමේ සහකරුවන් ලෙස හඳුන්වා ඇත.

ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් සමාජ සාධාරණත්වයේ නාමයෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම කරනු ලබයි. පරිපූර්ණ ගත තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමෙන් හා ශ්‍රී ලාංකාවේ සමාන පුරවැසියන් වශයෙන් තම දැනුම අත්දැකීම් හා සුවිශේෂී නිපුණතා මත හැකියාවන් ජාතික සංවර්ධනය සඳහා දායක කිරීමේ අවස්ථාවන් ඔවුනට ලැබෙනු ඇත.

ආබාධ සහිත තැනැත්තන් සහ ඔවුන්ගේ සංවිධාන හා දෙමාපිය සංවිධාන බල ගැන්වීම,මෙම ප්‍රතිපත්තියේ ප්‍රධාන මුල ධර්මයක් වන අතර, එය ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීමේ දී මූලික වන්නේ බලගැන්වීමයි.

මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම (2017-2021) ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වර්ගීකරණයකට ලක් කර එයට වගකිවයුතු රාජ්‍ය ආයතන දක්වා තිබුණි. ඒ අනුව

ආබාධිතයන් පිළිබඳව පහත කාර්යයන් ඉටුකිරීමේ වගකීම සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයට අයත් කාර්යභාරයන් පිළිබඳ විස්තර පහත ඡේදවල දක්වා ඇත.

## 2.1 සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයේ කාර්යභාරය

ප්‍රතිපත්තිය පරිදි උක්ත අමාත්‍යාංශයේ කාර්ය භාරය පහත පරිදි වේ.

### 2.1.1 ස්වාධිපත්‍ය පිලිබඳ අයිතිවාසිකම්

සෑම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයකුගේම පුද්ගල ස්වාධිපත්‍ය, පෞද්ගලිකත්වය සහ පුරවැසිභාවයට ගරු කිරීම සහ සහභාගිත්වය, ස්වයං නියෝජනය සහ තමා වෙනුවෙන් කථා කිරීම සඳහා පරිසරයක් සහතික කිරීම මානසික හා කායික ආබාධ සහිත පුද්ගලයින් සඳහා නිර්මාණය කල සහ ඔවුන් භාවිතා කරන ප්‍රධාන සේවා සියල්ල හදුනාගැනීම.

### 2.1.2 ප්‍රමාණවත් ජීවන මට්ටමක් සහ සමාජ ආරක්ෂාව තහවුරු කිරීම

අ. අන්‍යයන් සමඟ සමාන පදනමක් මත ප්‍රධාන ධාරාවේ සමාජ ආරක්ෂණ වැඩ සටහන් තුල විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් පූර්ණ වශයෙන් ඇතුලත් කිරීම සඳහා සුදුසුකම්ලත් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සමාජ ආරක්ෂාව සහ දිළිඳුකම තුරන් කිරීමේ යෝජනා ක්‍රම මඟින් සමානව ප්‍රතිලාභ ලබාදීමට ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ව්‍යුහය තුල ස්ථාපිත කිරීම.

ආ. දැනට පවත්නා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශේෂ වූ සමාජ ආරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා යෝග්‍යතාව, අනෙකුත් පොදු සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් සීමා නොකරන බව සහතික කරමින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා යෝග්‍යතා නිර්ණායක සංවර්ධනය කිරීම සහ ප්‍රසිද්ධ කිරීම.

ඇ. පුද්ගලයාගේ කැමැත්ත සහ මනාපයට ගරු කරමින් වීදියේ හෝ ස්ථිර වාසස්ථානයක් නොමැතිව ජීවත්වන මානසික ආබාධ සහිත පුද්ගලයින් සඳහා සහාය සහ සේවා ලබා දීම.

ඈ ආර්ථික සංවර්ධන සැලසුම් සහ උපායමාර්ග ඇතුලත් කිරීම සඳහා සංවර්ධන ප්‍රතිපත්ති පිළිබිඹු කරන ක්‍රමෝපායන් හා සැලසුවලට අදාල ක්‍රියාවලීන් ප්‍රතිඵල හා අයවැය මඟින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් නිශ්චිතව හඳුනාගැනිම.

### 2.1.3 සෞඛ්‍ය ආරක්ෂක සේවාව

අ. ආබාධිතභාවය සහ අදාල සෞඛ්‍ය රක්ෂණ මැදිහත්වීම් කලින් හඳුනාගැනිම සඳහා පූර්ව උපත් සහ පසු උපත් සෞඛ්‍යාරක්ෂාව තුල වන පරතර සහ අඩුපාඩු හඳුනාගැනීම සඳහා දැනට පවත්නා මූලික සෞඛ්‍යාරක්ෂක සේවා ඇගයීම.

ආ. පහත සඳහන් දෑ මනෝ සමාජීය ආබාධ සහිත පුද්ගලයින් සහ අදාල සිවිල් සමාජ සංවිධාන සමඟ උපදේශකත්වයෙන් මාර්ගෝපදේශ සකස් කර ප්‍රකාශයට පත් කිරීම.

- කලින් හඳුනාගැනීම / නරක අතට පත්වීම වැලැක්විම.
- වර්ධිත සහභාගිත්වය සහ සහයෝගය
- ආරක්ෂාව ලබා දෙන්නන් සහ සේවා සපයන්නන්ට පුහුණුව ලබාදීම.
- තමන්ට සහ අන්‍යයන්ට හානි සිදුවීමේ අවධානමෙන් ආරක්ෂිත වීමට මේවා තුලනය කරමින් සිය කැමැත්තෙන් තොරව සිදු කරන ප්‍රතිකාර අඩු කිරීම ඇතුළුව ක්‍රියාපටිපාටි සහ ආරක්ෂාව පාලනය.

ඇ. පවුලට සහ පවුල් ජීවිතයට ගරු කිරීම සඳහා විශේෂ අවශ්‍යතා සහිත තරුණයින් සහ ඔවුන්ගේ රැකවරණය සපයන්නන් ඉලක්ක කරගත් අධ්‍යාපනික වැඩ සටහන් හරහා සම්බන්ධතා, විවාහය සහ මාතෘත්වය /පීතෘත්වය ඇතුළු විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ඉස්මතු කිරීමට හා ඔවුන්ගේ කැමැත්ත පරිදි කටයුතු කිරිමේ හැකියාව ලබාදීම.

**2.1.4** ප්‍රවේශවීමේ හැකියාව සහිත නිර්මිත පරිසරය, ප්‍රවාහනය, සන්නිවේදනය, සහ උපකාරක හා තාක්ෂණය

අ. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට අන්‍යයන් හා සමාන පදනමක් මත ජීවිතයේ සියළුම අවස්ථාවන් සඳහා නිදහස්ව සහභාගී වීම සහ ඔවුන්ගේ ප්‍රජාව සමඟ ස්වාධීනව ජීවත්විම සහතික කිරීම සඳහා පරිසරය ගොඩ නැඟීම

2016 ප්‍රවේශවීමේ රෙගුලාසිවල දක්වා ඇති සම්මතයන් සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම, එවැනි රෙගුලාසි පිළිනොපදින රජයේ ගොඩනැගිලි හිමිකරුවන්ට එරෙහිව පැමිණිලි ලබා ගැනීම සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට යාන්ත්‍රණ පිහිටු විම.

ආ. තොරතුරු සහ සන්නිවේදනයට පිවිසීමේ හැකියාව

- ශ්‍රී ලාංකීය සංඥා භාෂාව විධිමත්ව පිළිගැනීම, නීතිගත කිරීම සහ එය ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා රජය විසින් විශේෂිත ක්‍රියාමාර්ග ගැනීම.

- සංඥා භාෂණ පරිවර්තනය සඳහා ජාතික සහතික පත් වැඩසටහනක් සකස් කිරීම.

- වෘත්තීමය සහතිකලත් සංඥා භාෂණ පරිවර්තකයින් 100 ක් ඩිප්ලෝමා මට්ටම තුළින් පුහුණු කිරීම.

- විශේෂ අවශ්‍යතාවයන් සහිත පුද්ගලයන්ට දැනුවත්භාවය ලබා ගැනීමට හැකි වන පරිදි සියලුම රාජ්‍ය මාධ්‍යවල ප්‍රවෘත්ති විකාශයන් අතරින් අවම වශයෙන් 50% ක් මුද්‍රණ හා දෘශ්‍ය මාධ්‍යයෙන්,විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට දැන ගැනීමේ හැකියාව ඇති ආකාරයෙන් විකාශය කිරිම.
  (බ්‍රේල්, විශාල මුද්‍රණ,පහසු කියවීමේ ආදර්ශ ,සංඥා භාෂණ පරිවර්තනය,සංඥා භාෂණ වීඩියෝ).

- රජය තුළ පිවිසිය හැකි තොරතුරු සඳහා සහ උපකාරී පදනමක් මත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට පිවිසිය හැකි තොරතුරු ලබා දීම සඳහා අවශ්‍ය සේවා සැලසීමට ඕඩියෝ සහ බ්‍රේල් තොරතුරු සඳහා පිටපත් කිරීමක් සහ නිෂ්පාදන සේවාවක් සංවර්ධනය කිරිම.

ඇ. උපකාරී සහ භාවිතා කළ හැකි තාක්ෂණයට පිවිසිය හැකිවිම

- සවන්දීමේ සහ පෙනිමේ දුර්වලතා සහිත විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා භාවිතා කිරීමට නිර්මාණය කළ සන්නිවේදන උපාංග ලබා ගැනීමේ හැකියාව වැඩි කිරීම සඳහා අනුග්‍රහ සහ බදු රහිත යෝජනා ක්‍රම හදුන්වාදිම.

**2.1.5** යුක්තියට ප්‍රවේශය

(අ) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට යුක්තිය සඳහා ප්‍රවේශ විය හැකිය. (උදා පොලිසියට පැමිණිලි කිරිම, නිතී කටයුතුවලට සහභාගී වීම, නීති බල ගැන්වීම් ආයතන හා උසාවිවලට පිවිසීම,සාක්ෂිකරුවෙකු ලෙස කටයුතු කිරීම)

(ආ) පොලිස් ස්ථාන තුළ ආබාධිතභාවය පිළිබඳ අවධානයට ලක්වන කේන්ද්‍රීය කරුණු ඇතුළත් කිරිම.(මෙම අවධානය පිළිබඳව කේන්ද්‍රිය කරුණු සංඥා භාෂාණ පරිවර්තකයින් සහ බ්‍රේල් උපකරණ තුළින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට සේවය ලබාදීම සඳහා සම්පත් සහ හැකියාවන්ගෙන් සමන්විත විය යුතුය.)

**2.1.6** කාන්තා සහ ළමා සුභසාධනය

(අ) විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ හඳුනාගත් / ප්‍රමුඛතාගත ගැටළු සඳහා විසඳුම් ලබාදීම.

(ආ) විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ ගැටළු පිළිබඳ සාකච්ඡා කිරීම සහ විසඳුම් ලබා දීම සඳහා අදාළ රජයේ ආයතනවල සහභාගිත්වයෙන් ආසන්න ඉහළ මට්ටමේ තීරණ ගැනීමේ කමිටුවක් පත් කිරීම.

(ඇ) හඳුනාගත් ගැටළු සහ දැනටමත් අනුමත 2014 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ වෙනස් ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීම.

(ඇ) පුහුණුව, උපදේශනය සහ පසු විපරම් කටයුතු කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සහිතව විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ට ආදායම් ඉපයීමේ සහාය ලබාදීම සඳහා වෙනම රාජ්‍ය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරිම .

(ඉ) කාන්තා ගැටළු විසඳන බව සහ හිමිකම් උල්ලංඝනය නොකරන බව සහතික කිරීම සඳහා අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ දිස්ත්‍රික් මට්ටමේ නියාමන කමිටු පත් කිරිම.

(ඊ) කාන්තා ගැටළු විසඳන බව සහතික කිරීම සඳහා දිස්ත්‍රික් නියාමන කමිටු සමාජිකයන්ගේ සහභාගිත්වයෙන් විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ ජාතික මට්ටමේ නියාමන කමිටු පත් කිරීම.

(උ) පොදු ජනතාව සංවේදිකරණය සඳහා විශේෂ අවශ්‍යතා සහිත කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත් තුළින් ජාතික මට්ටමේ දැනුවත් කිරිම් සිදු කිරීම.

2.1.7 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ හිමිකම් ආරක්ෂා කිරිමට, ගරු කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ව්‍යවස්ථාමය ප්‍රතිපත්තිමය සහ ආයතනිකමය වශයෙන් කටයුතු කිරීම.

(අ) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ අනෙකුත් ජාත්‍යන්තර රාමු සමඟ අනුරූපවන බව සහතික කිරිමට නීති සංශෝධනය සඳහා සකස් කරමින් පවතින ආබාධිතභාවය පිළිබඳ නීති සමාලෝචනය කර සංශෝධනය කිරීම.

(ආ) සමාලෝචනය සිදු කිරීම සඳහා මානව හිමිකම් නීතිය තුළ අධ්‍යාපනඥයින් සහ වෘත්තිකයන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ හිමිකම්වලට අදාළ වෙනත් අංශයන් විශේෂඥයින් (උදා-අධ්‍යාපනය, ප්‍රවාහනය, නාගරික සංවර්ධනය,මාධ්‍ය,මානසික සෞඛ්‍ය) ඇතුළුව සිවිල් සමාජ ප්‍රවීණයින්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීම.

(ඇ) විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් තහවුරු කෙරෙන වැඩසටහන් සහ සේවාවන් ලබාදීමේ දී සාක්ෂි පදනම් වැඩි දියුණු කිරීම සඳහා ආබාධිතතාව විෂය කොටගත් දත්ත ජාතික පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය මට්ටමින් රැස් කිරීම, වාර්තා කිරීම සහ භාවිතා කිරීම.

සමාජ සවිලබගැන්වීමේ අමාත්‍යාංශය විසින් ඉහත අංක 2.1.1 සිට 2.1.7 දක්වාවූ ක්‍රියාකාරකම් සම්බන්ධව පූර්ණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර මෙම ක්‍රියාකාරකම්වලින් කොටසක් පමණක් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ආයතන මත අබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව, සමාජ සේවා දෙපාර්තමේන්තුව යන ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබයි.මේ යටතේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් ඉටුකරන කාර්යභාරයන් පිළිබඳව මෙම වාර්තාව මගින් සැලකිල්ලට ගන්නා ලදී.

## 2.2 විගණනය සඳහා මාතෘකාව තෝරා ගැනීම

විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් (ආබාධ සහිත තැනැත්තන්) කෙරෙහි සැලකිල්ලක් නොදක්වන්නාවූ සහ ඔවුන් වෙනත් වර්ගයක පිරිසක් වශයෙන් දකින්නාවූ, ඔවුන්ද සමාන මානව අයිතිවාසිකම් හා වගකීම් ඇති මිනිසුන් ලෙස නොදකින්නාවූ, වෙනත් පුද්ගලයන්ට ලබා ගත හැකි සමාන අවස්ථා ඔවුන්ට ලබා නොදෙන්නා වූ, සහ සිය ආබාධිතබව නිසා ආබාධ ඇති තැනැත්තන් ප්‍රධාන සමාජ ධාරාවෙන් බැහැර කරන්නා වූ යනාදී තත්ත්වයන් වර්තමාන සමාජයෙන් බැහැර කර එම පුද්ගලයන්ද සමාජයේ සමාන අයිතිවාසිකම් ඇති පුද්ගලයන් බවට පත්කරලීමට රාජ්‍ය අංශයේ මැදිහත්වීම ප්‍රධාන වශයෙන් සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය මගින් සිදුකරයි.

ආබාධ සහිත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වයට පිටුවහලක් වීමට, ඔවුන් සමාජයේ ශක්තිමත් පුද්ගලයන් බවට පත්කිරීමට විවිධ සහන සැලසීම සඳහා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ පවත්නා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් මැදිහත්වී ක්‍රියා කරන ආයතන වේ.

ඉහත ආයතන වෙත රජය විසින් වාර්ෂිකව අයවැය මගින් සැලකිය යුතු ප්‍රතිපාදනයන් ලබාදෙන අතර එම මුදල් අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන්ගේ ආර්ථික, අධ්‍යාපනික සහ සමාජමය තත්ත්වය ශක්තිමත්ව පවත්වා ගෙන යෑමට හැකියාවක් ලැබී තිබේද යන්න ඇගයීම සඳහා මෙම මාතෘකාව තෝරා ගන්නා ලදි.

## 2.3 විගණන අරමුණු

මෙම කාර්ය සාධන විගණනයේ මූලික අරමුණ වන්නේ ආබාධ සහිත පුද්ගලයන්ට සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය විසින් සිදු කරන මූල්‍ය ප්‍රතිපාදන සාධාරණ ලෙස ලබාදී තිබේද, ඒවා භෞතිකව උපයෝජනය කර ඔවුන් සමාජයේ සාමාන්‍ය ජනතාව සමඟ සමාන අයිතිවාසිකම් භුක්ති විඳින තත්ත්වයකට පත්කර තිබේද යන්න පිළිබඳ ඇගයීමයි.

ආබාධ සහිත තැනැත්තන් සවිබලගැන්වීම සඳහා 2014 සිට 2019 ජූනි 30 දක්වා වසර 05 ක කාල සීමාව තුල මහ ලේකම් කාර්යාලයේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අරමුදලේ මුදල් ලැබීම් හා වියදම් දැරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 .06.30 දිනට | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| රජයේ ප්‍රධාන | 46.860,000 | 35.829.286 | 40,000,000 | 42,000,000 | 43,000,000 | 36,500,000 | 244,189,286 |
| සුපිරි වාසනා අරමුදලින් ලැබීම් | 35,451,533 | 40,992,790 | 33,793,090 | 25,464,899 | 23,847,060 | 10,400,000 | 169,949,372 |
| ආදායම් එකතුව | 35,451,533 | 40,992,790 | 73,793,090 | 67,464,899 | 66,847,060 | 46,900,000 | 414,138,658 |
| i.නිවාස ඉදිකිරීම සඳහා ආධාර ලබාදීම | 33,643,804 | 24,592,505 | 49,845,980 | 35,907,440 | 18 ,742,761 | 2,073 ,045 | 164,805,535 |
| ii.ආධාරක උපකරණ ලබාදීම | 29,762,905 | 10,113,305 | 13,548,357 | 13,137,000 | 13,030,893 | - | 79,592,460 |
| iii.ස්වයං රැකියා ආධාර ලබාදීම | 6,241,349 | 10,169,442 | 9,298,904 | 9,987,610 | 10,053,057 | 7,030,000 | 52,780,362 |
| අධ්‍යාපන ආධාර ලබාදීම | 1,648,950 | 1,779,320 | 3,132,382 | 3,591,021 | 3,957,431 | 3,242,000 | 17,351,104 |
| වෛද්‍ය ආධාර ලබාදීම | 6,260,573 | 8,494,983 | 6,064,391 | 7,338,560 | 8,888,806 | 7,530,000 | 44,577,313 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ------------ | ------------ | ------------ | ------------- | ------------- | ------------- | -------------- |
| 77,577,581 | 55,149,555 | 81,890,014 | 69,961,631 | 54,672,948 | 19,875,045 | 359,106,774 |
| ======= | ======= | ======= | ======= | ======== | ======== | ======== |

## 2.4 විගණන විෂය පථය

(අ) ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් ලබාදෙන ආධාර සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදි. ඒ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින සමාජසේවා අංශයන්හි කටයුතු කෙරෙහිද විගණනයේදී අවධානය යොමු කරන ලදි. ඒ අනුව ගාල්ල, කළුතර, කෑගල්ල, මහනුවර සහ කොළඹ යන දිස්ත්‍රික්ක **05** හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල **13** ක සමාජසේවා අංශයන් පරීක්ෂාවට ලක් කරන ලදි.

(ආ) ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ආබාධ සහිත පුද්ගලයන්ට ලබාදුන් නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර භෞතිකව පරීක්ෂාවට භාජනය කරන ලදි.

(ඇ) මෙම කාර්ය සාධන වාර්තාවට **2014** වර්ෂයේ සිට **2019** ජුනි දක්වා ආබාධ සහිත තැනැත්තන්ට ලබාදෙන ආධාර සහ සහන පිළිබඳව අමාත්‍යාංශයේ වාර්තා මගින් දත්ත ඇතුළත් කරන ලදි.

## 2.5 සම්බන්ධිත ආයතන හා කාර්යභාරය

ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සහ සමාජසේවා දෙපාර්තමේන්තුව මේ සඳහා සම්බන්ධිත ආයතන වන අතර එහි කාර්යභාරයන් පහත සඳහන්වේ.

| ආයතනය | කාර්යයන් |
|---|---|
| ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය | (අ) ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභසාධන ප්‍රවර්ධන කිරීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම<br>(ආ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගතහැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාම<br>(ඇ) ආබාධ වලට ප්‍රධාන හේතු මොණවාදැයි සොයා දැන ගැනිම සහ ඒවා වැලැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායි පියවර ප්‍රවර්ධනය කිරීම.<br>(ඈ) ආබාධ සහිත තැනැත්තන්ගේ පුනරුත්තාපනය කිරිම |

සඳහා ගත යුතු පියවර සකස් කොට ඒවා ප්‍රවර්ධනය කිරිම.

(ඉ) ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොද ජීවන තත්ත්වයක් ඇති කිරිමට වගබලා ගැනිම.

(ඊ) ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපුරාලන බවට වග බලා ගැනිම.

(උ) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දීම

(ඌ) ආබාධ සහිත තැනැත්තන් රැකබලා ගැනිම සඳහා පිහිටුවන ලද ආයතනවල කටයුතු සඳහා මග පෙන්වීම, ඒවාට සහය දීම, ඒ කටයුතු සම්බන්ධිකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම,

(ඉ) ආදායම් ලැබෙන සේවා නියුක්තිවල යෙදීමට , හැකි සෑම විටම සහය දීම.

(ඊ) ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරිමේ ක්‍රම පිළිබඳව අධ්‍යයන සහ පර්යේෂණ සඳහා ධෛර්ය දීම හා සියළු ක්‍රියාකාරකම් විෂයෙහිලා ඔවුන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම

සමාජසේවා දෙපාර්තමේන්තුව

(අ) ආබාධ සහිත පුද්ගලයන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනාගැනීම හා පුළුල් කිරීම.

(ආ) ආධාරක උපකරණ සැපයීම.

(ඇ) විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත්වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.

(ඈ) සේවා සපයන නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවීම.

(ඉ) ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම.

(ඊ) භාරකරුවන් අහිමි මන්ද මානසික පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.

(උ) ආබාධ සහිත පුද්ගලයන්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.

(ඌ) වයස අවු. 60 ට අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට පෙනීම ලබා දීම සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම.

(ඔ) දෘශ්‍යාබාධිත දරුවන්ට ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික ආධාර ලබාදීම.

## 2.6 විගණනය සඳහා අධිකාරී බලය

ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ සහ 2018 අංක 19 දරන විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණනය කරන ලදි.

## 2.7 විගණන ප්‍රවේශය

විගණන ප්‍රවේශය සඳහා පහත සඳහන් චක්‍රලේඛ වලින් සළසා ඇති ප්‍රතිපාදන සැළකිල්ලට ගන්නා ලදි.

- සම්මුඛ සාකච්ඡා
- තොරතුරු විශ්ලේෂණාත්මක පරීක්ෂාව
- භෞතික පරීක්ෂාව
- තොරතුරු කැඳවීම.
- අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති වාර්තා ආදිය

## 2.8 විගණන නිර්නායන

- 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පණත,
- 2003 ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය
- 2014 ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැළැස්ම,
- 2016 ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය
- 2017-2021 මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහාවූ ජාතික ක්‍රියාකාරී සැළැස්ම

## 3. විස්තරාත්මක විගණන ක්ෂේත්‍ර

### 3.1 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන් අවශ්‍ය පරිසරය ගොඩ නැගීම.

#### 3.1.1 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙනුවෙන් වූ ජාතික ප්‍රතිපත්තිය

සමාජසේවා අමාත්‍යාංශය විසින් 2003 අගෝස්තු මාසයේදී අබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.මෙහිදී ආබාධිතබව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සමාජ යුක්තියේ නාමයෙන් ආබාධ ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ සහ ආරක්ෂා කිරීම සිදු කරයි. ඔවුනට සමාන පුරවැසියන් මෙන් පූර්ණ සහ තෘප්තිමත් ජීවිතයක් ගතකිරීමේ හැකියාවන් ජාතික සංවර්ධනය සඳහා දායකවීමේ ඉඩ ප්‍රස්ථා ලැබෙනු ඇත. මෙම ප්‍රතිපත්තිය යටතේ ආබාධිත පුද්ගලයන්ගේ ආදායම, රැකියාව, වෘත්තීය නිපුණතා, අධ්‍යාපනය, නිවාස, සෞඛ්‍ය සහ සමාජසේවා යන මූලික කරුණු ඉටුකරලීම සිදුකිරීමයි.

#### 3.1.2 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත

1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත, ආබාධ සහිත තැනැත්තන් උදෙසාවූ ජාතික සභාවක් පිහිටුවීම සඳහාද ශ්‍රී ලංකාවේ සිටින ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, අභිසංවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ අනුශාංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ක්‍රියාත්මක කරන ලද පනතක් වන අතර මෙම පනතේ ප්‍රතිපාදනයන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

පනතේ 13 වන වගන්තියේ ආබාධ සහිත පුද්ගලයන් සඳහා කර්තව්‍යයන් 22 ක් දක්වා ඇති නමුත් එහි දක්වා ඇති පහත සඳහන් කර්තව්‍යයන් මෙතෙක් ඉටුකිරීමට කටයුතු කර නොතිබුණි. ඇමුණුම( 01)

(අ) ආබාධ සහිත තැනැත්තන්ගේ සුභසාධන ප්‍රවර්ධන කිරිම සහ ඔවුන් ආරක්ෂා කිරිම සඳහා වූ යෝජනා ක්‍රම නිර්දේශ කිරීම.

(ආ) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගතහැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාම.

(ඇ) ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරීමේ වැඩ පිළිවෙළවල් හඳුන්වා දීම සහ තොරතුරු ලබා දීමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබා ගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(ඇ) ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ආණ්ඩුව විසින් සහ ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගල මණ්ඩල විසින් සකස් කරන ලද, මුලාරම්භ කරන ලද සහ ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙල සහ යෝජනා ක්‍රම අධීක්ෂණය කිරිම සහ සම්බන්ධීකරණය කිරීම සහ එවැනි කාර්ය සඳහා ප්‍රදාන ලබා දීම හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.සමාලෝචිත වර්ෂය වනවිට ස්වේච්ඡා සංවිධාන 138 ක් ලියාපදිංචි කරගෙන තිබුණද එම ආයතන අධීක්ෂණය කිරීමේ කටයුතු කර නොතිබුණි.

**3.1.3** විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳ කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම

(අ) ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරි සැළැස්ම අනුව ජාතික වශයෙන් ආබාධිත බව දත්ත එකතුවෙහි ඇතුළත් විය යුතුය. 2012 වර්ෂයේ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සමීක්ෂණයේදී ශාරීරික හා මානසික අපහසුතා ඇති පුද්ගලයින් 1,617,924 ක් සංඛ්‍යා ලේඛණවලට ඇතුළත් කර ඇති බව දක්වා තිබුණු අතර එම සංඛ්‍යා ලේඛණ ජාතික මහ ලේකම් කාර්යාලයද උපයෝගී කරගෙන තිබුණි. කෙසේ වුවත් එම සංඛ්‍යා ලේඛණයට අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් පිළිබඳව වෙන් වශයෙන් දත්ත ඇතුළත් කර නොතිබුණි.

(ඇ) රටතුළ ජීවත්වන ආබාධිත පුද්ගලයන්ගේ යාවත්කාලීන තොරතුරු පිළිබඳ දත්ත බැංකුවක් පවත්වාගෙන යාම. ආබාධිත පුද්ගලයන් පිළිබඳ තොරතුරු නොමැතිවීමට ප්‍රධාන අඩුපාඩුවක් බව නිරීක්ෂණය වූ අතර අමාත්‍යාංශය විසින් මේ සඳහා වැඩ පිළිවෙලක් ද ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම තොරතුරු පද්ධතිය සකස් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් 2014 දෙසැම්බර් 31 දිනට ලබාදෙන ලෙසත් 2014 අගෝස්තු 20 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝගයක් ලබාදී තිබුණු අතර එය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා 2018 සැප්තැම්බර් 07 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්ද නැවත එම නියෝගය ක්‍රියාත්මක කළ යුතු බව දක්වා තිබුණි.

(ඇ) 2019 වර්ෂයේදී දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා රු.මිලියන 15 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ඒ සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැළැස්මට අනුව සැප්තැම්බර් 30 දින වන විට දත්ත සකස් කරගැනීමේ ක්‍රියාවලියේ සියයට 75 ක් අවසන් විය යුතු අතර ප්‍රතිපාදනයෙන් රු.මිලියන 9.50 ක් ඒ වනවිට වියදම් දැරිය යුතුව තිබුණි. නමුත්

2019 ඔක්තෝබර් 31 දින වන විටත් දත්ත සකස් කිරීම සඳහා සැළසුම් සකස් කිරීම ආරම්භ කර නොතිබුණි. ඒ අනුව ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිව පැවතිණි.

(ඉ) කෙසේවුවද විගණනය විසින් දිස්ත්‍රික්ක 05 ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ විස්තර පරීක්ෂාවේදී එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක සමාජසේවා නිලධාරීන් විසින් අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගයන් 7,065 දෙනෙකුගේ විස්තර ලේඛණ ගත කර තිබුණි. විස්තර ඇමුණුම් 2 හි දැක්වේ.

**3.1.4** අබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් අදාළ කාර්යභාරයන් ඉටුකිරීම සඳහා මහලේකම් කාර්යාලය ලබාදී ඇති මානව සම්පත්වල ඌණතා

අබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයේ කාර්යභාරයන් විධිමත්ව ඉටුකිරීම සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/බී1/41/03 සහ 2018 මාර්තු 19 දිනැති ලිපිය අනුව ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයට තනතුරු 16 ක් සඳහා කාර්ය මණ්ඩලය 40 ක් අනුමත කර තිබුණි. එම තනතුරු තුළ නීති නිළධාරි, තාක්ෂණ නිලධාරී, සංඥා භාෂා පරිවර්තක, ගණකාධිකාරී සහ බ්‍රේල් උපදේශක තනතුර යන ප්‍රධාන තනතුරු ද ඇතුළත් විය. කෙසේ වුවද නොවැම්බර් මාසය වන විටත් ලේකම් කාර්යාලය සඳහා ස්ථිර නිළධාරීන් බඳවා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යංශයට අනුයුක්ත කාර්යය මණ්ඩලයේ 26 දෙනෙකු මගින් සභාවේ කටයුතු ඉටුකරමින් පැවතිණි. ලේකම් කාර්යාලයට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොසිටීම හේතුවෙන් ආබාධිතයන් වෙත ලබාදෙන සහන සේවා සහ ආධාර මුදල් ලබාදීම සඳහා වැඩසටහන් සකස් කිරීමට හා එවා නිසි පරිදි උපයෝජනය කර තිබේද යන්න පසුවිපරම් කරගැනීමට නොහැකිවී තිබුණි.

**3.2** ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් ක්‍රියාත්මක විවිධ වැඩසටහන්

**3.2.1** නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන

**3.2.1.1** නිවාස වැඩපිළිවෙල සඳහා කෙරෙන අනුග්‍රාහකත්වය

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත තැනැත්තන් සමාජය තුල සවිබල ගැන්වීමේ එක් ප්‍රධාන අංශයක් ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව මඟින් 2002 වර්ෂයේ සිට නිවාස ආධාර ලබාදිමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව නව නිවසක් ඉදිකර ගැනීම සඳහා රු.250,000 ක් සහ පවත්නා නිවසක් අළුත්වැඩියා කර ගැනීම සඳහා රු.150,000 ක්ද වශයෙන් ආධාර මුදලක් ලබාදෙනු ලැබේ. මේ සඳහා ප්‍රතිපාදන ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සුපිරි වාසනා සම්පත ලොතරැයිපත්

අලෙවියෙන් ලබන මුදලින් සියයට 5 ක් ආබාධ සහිත තැනැත්තන් සඳහාවූ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත ලබා දෙනු ලැබේ.

**3.2.1.2** නිවාස ආධාර ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදය

අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන්ට නිවාසයක් තැනීම සඳහා එම පුද්ගලයාටම අයත් ඉඩම් කැබැල්ලක අයිතිව තිබිය යුතුය. එසේම නිවාස ආධාරය අවශ්‍ය ආබාධ සහිත පුද්ගලයා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජසේවා නිලධාරියා වෙතින් අදාල අයදුම්පත්‍ර ලබාගෙන ග්‍රාමසේවක සහ ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ ජාතික මහ ලේකම් කාර්යාලය වෙත නිර්දේශය සඳහා ඉදිරිපත් කල යුතුය. ජාතික මහ ලේකම් කාර්යාලය විසින් දිස්ත්‍රික් පදනම මත අයදුම්පත්‍ර ලේඛණගත කර අරමුදල් ලැබෙන ක්‍රමවේදයට අනුව ආධාර ලබා දෙනු ලැබේ.

**3.2.1.3** නිවාස ආධාර ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජාතික මහ ලේකම් කාර්යාලය විසින් දිස්ත්‍රික්ක 25 තුල ජීවත්වන අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් වෙත ලබාදෙන නිවාස ආධාර සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන දත්ත පද්ධතිය අනුව 2014 වර්ෂයේ සිට 2019 ජූනි 30 දින දක්වා නිවාස 984 ක් ඉදිකිරීමට පළමු වාරිකය ලෙස රු.98,371,506 ක්ද ඉතිරි වාරික වශයෙන් රු.103,608,996 ක් ගෙවීම් සිදුකර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| | විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 ජූනි 30 දිනට | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| I. | ආධාර ලබාදුන් නිවාස සංඛ්‍යාව | 197 | 109 | 427 | 98 | 66 | 87 | 984 |
| II. | ගෙවා තිබූ මුදල රු.මිලියන | 20.1 | 10.8 | 42.5 | 9.7 | 6.8 | 8.6 | 98.4 |

මේ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත පරිදිවේ.

(අ) ආබාධිත පුද්ගලයකුට ජීවත්වීම සඳහා ලබාදෙන නිවාස ආධාරයට සරිලන පරිදි ඉදිකළයුතු නිවාස පිළිබඳ නියමිත ප්‍රමිතිගත සැළසුම් හඳුන්වාදී නොතිබුණි. මේ හේතුවෙන් ලබාදෙන මුදලට සරිලන පරිදි නිවාස ඉදිකර අවසන් කරගැනීමට නොහැකිව තිබූ අවස්ථා නිරීක්ෂණය විය. තවද 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා දිස්ත්‍රික්ක 25 තුළ රු.250,000 බැගින් නව නිවාස 570 ක් ඉදිකිරීම අනුමත කර තිබූ නමුත් එක් නිවසකට රු.250,000 ක් බැගින් නිවාස 357 ක් සඳහා රු.89,250,000 ක් පමණක් නිවාස ආධාර ලෙස ලබාදී තිබුණි. මෙම නිවාස ඉදිකර අවසන්වූ පසුව ඒ බව සඳහන් කර අවසන් ප්‍රගති වාර්තාවක් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා

නිලධාරී විසින් මහ ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් සම්පූර්ණ මුදලම ගෙවා අවසන්වූ නිවාස 357 න් නිවාස 251 ක් සඳහාම ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. විස්තර ඇමුණුම් 3 හි දැක්වේ.

(ආ) අබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් වාර්ෂිකව අනුමත කර ඇති නිවාසවලට සම්පූර්ණ මුදල ගෙවීමෙන් පසුව ප්‍රගතිය පරීක්ෂා කිරීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම ඉහත (අ) සඳහා හේතුවී තිබුණි.

(ඇ) ජාතික මහලේකම් කාර්යාලය විසින් නිවාස ඉදිකිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සම්පූර්ණ මුදල ලබාදී තිබූ නමුත් අදාළ ආබාධිතයා වෙත වාරික මුදල් ලබාදීම සිදුකර නොතිබූ අවස්ථාද නිරීක්ෂණය විය. මේ හේතුවෙන් වාර්ෂිකව ලබාදෙන මුදල නිසි උපයෝජනයක් සිදුවී ඇද්ද යන්න ඇගයීමට පසුවිපරමක් සිදු නොවන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) නිවාසයක් ඉදිකිරීම සඳහා ලබාදෙන ආධාර මුදල වාරික 03 කින් ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දෙනු ලැබුවද එය ආබාධිත පුද්ගලයා වෙත හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත්වන පවුලේ සාමාජිකයාට ලබාදෙන පිළිවෙල පිළිබඳව විධිමත් වැඩපිළිවෙලක් නොමැති අතර ඒ සම්බන්ධව ආබාධිත පුද්ගලයා හෝ ඒ වෙනුවෙන් ඉදිරිපත්වන පවුල් සාමාජිකයාට දැනුවත් කිරීමක් සිදුකර නොමැතිබව භෞතික පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. මේ හේතුවෙන් 2014 වර්ෂයේ සිට 2019 ජූනි 30 දින දක්වා දිස්ත්‍රික්ක 22 ක ඉදිකිරීම් ආරම්භ කර තිබූ නිවාස 219 කට රු.20,642,400 ක් වූ ශේෂ වාරික ගෙවිය යුතුව තිබුණි. වසර 05 ක පමණ කාලයක් වාරික ලබාදීමේ ප්‍රමාද තත්ත්වයක් පැවතිණි. මේ හේතුවෙන් නිවාස ඉදිකිරීම ප්‍රමාදවීම හෝ නිවාස ඉදිකිරීම අතරමග නැවතීම සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ විස්තර ඇමුණුම 4 හි දැක්වේ.

(ඉ) එසේම නිවාස ආධාරලාභියා අබාධිත පුද්ගලයකු බැවින් ඉදිකිරීම් කටයුතු පිළිබඳ ඉහත 3.3.3 පරිදි දැනුවත් කිරීම් මෙන්ම ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා මඟපෙන්වීම සහ පසුවිපරම් කටයුතුද සිදුකල යුතුවේ. නමුත් ඔවුන්ට එවැනි මඟපෙන්වීම් ලබාදීම හෝ පසුවිපරම් කිරීමක් සිදු කර නොතිබූ බවත් ඒ හේතුවෙන් නිවාස ඉදිකිරීම් අතරමග නතරකර තිබූ බවත් නිරීක්ෂණය විය.

(ඊ) දිවයිනේ දිස්ත්‍රික්ක 08 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක සිටි තෝරාගත් ආබාධිත පුද්ගලයන් 13 දෙනෙකුට රු.250,000 බැගින් නව නිවාස ඉදිකිරීම සඳහා සම්පූර්ණ වාරික 4 ක්, 3ක් හෝ 2 ක් වශයෙන් වාරික මුදල් ලෙස රු.1,925,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද, මෙම ආබාධිත පුද්ගලයන් තම නිවාස ඉදිකිරීම අතරමග නතර කර තිබුණි. මේ සඳහා හේතුවී තිබුණු කරුණු සොයාබලා නිවාස සම්පූර්ණ කිරීමට අවශ්‍ය මඟපෙන්වීම් ලබාදීම අදාල නිලධාරීන් සිදුකර නොතිබුණි. මේ පිළිබඳ විස්තර ඇමුණුම 5 හි දැක්වේ.

(ඍ) අඩු ආදායම්ලාභී ආබාධිතයන්ගේ නිවාස ආධාර ඉල්ලීම් අනුමතවූ පසුව මහ ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය ලේකම් වෙත වාරික 03 ක් හෝ 02 ක් වශයෙන් මුදල් යවනු ලැබේ. පසුව එම මුදල ආබාධිතයාට අදියර 05 ක් යටතේ ලබාදෙනු ලැබේ. මෙහිදී අබාධිතයා ගේ යම් අපහසුතාවයන් මත නිවස ඉදිකිරීමට ප්‍රමාද තත්ත්වයන් පවතින්නේද යන්න සමාජසේවා නිලධාරී විසින් පරීක්ෂා කළ යුතුය. එහෙත් අපහසුතාවයන් පිළිබඳ සොයා නොබැලීම හේතුවෙන් දිස්ත්‍රික්ක 07 ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක ආබාධිත පුද්ගලයන් 13 දෙනෙකු වෙත නිවාස ඉදිකිරීම සඳහා ලබාදී තිබුණු රු.1,650,000 ක් නිවාස ඉදිනොකිරීම හේතුවෙන් මහ ලේකම් කාර්යාලයට ආපසු එවා තිබුණි. මෙම මුදල් නැවත මහ ලේකම් කාර්යාලයට එවීමද වර්ෂ 01ත් 02 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව සිදු කර තිබුණි. ඒ හේතුවෙන් වෙනත් ආබාධිත පුද්ගලයකුට නිවසක් ඉදිකර ගැනීමට මුදල් ලබාදීමට ඇති අවස්ථාවන් ද මගහැරී තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 6 හි දැක්වේ .

(ඎ) ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වල යුද්ධයට මුහුණදී ආබාධිත තත්වයන්ට පත්ව ඇති පුද්ගලයන් බහුලව ජීවත්වන බැවින් එම පළාත් පිළිබඳවද නිවාස ආධාර ලබාදිම සම්බන්ධව විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුවේ. මහ ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන නිවාස ආධාර දත්ත පද්ධතියේ ඇතුළත් තොරතුරුවලට අනුව උතුරු නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක 08 ක නිවාස ආධාර ලබාදීම අවම මට්ටමක පවතින බව විගණනයට නිරීක්ෂණය විය. එනම් කිලිනොච්චිය හා වවුනියාව යන දිස්ත්‍රික්ක 02 ක සඳහා 2014 වර්ෂයේ සිට 2018 දක්වා නිවාස ආධාර ලබාදී නොතිබුණි. එම කාල පරිච්ඡේදය තුල දිස්ත්‍රික්ක 08 ඇතුළත ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව 131 ක් වී තිබුණි. විස්තර ඇමුණුම 7 හි දැක්වේ.

(එ) කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජසේවා අංශය විසින් ආබාධ සහිත පුද්ගලයන්ට නිවාස ආධාර ලබාදීම සම්බන්ධව පවත්වාගෙන තිබුණු ලේඛනයේ ප්‍රමාණවත් විස්තර ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව නිවාස ඉදිකරගැනීම සඳහා ආබාධිත පුද්ගලයන් 05 දෙනෙකුට රු.250,000 බැගින් අනුමතවී තිබුණු අතර රු.100,000 බැගින් මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණි. නමුත් 2019 සැප්තැම්බර් 02 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී එම මුදලින් ආබාධිතයන් 04 දෙනෙකුට රු.50,000 බැගින් ලබාදී නොතිබුණු අතර එම මුදල් පොදුතැන්පත් ගිණුමේ තැන්පත්කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම රු.100,000 ක් ලබාදිය යුතු තවත් ආබාධිතයකු මියගිය බව දැක්වුවද, එම පුද්ගලයාට මුදල් ලබාදුන් බව හෝ එම මුදල් මහලේකම් කාර්යාලයට ආපසු එවූ බව සටහන්වී නොතිබුණි. මේ සම්බන්ධව පසුවිපරම් කිරීමද සිදුවී නොතිබුණි.

### 3.2.2 ස්වයං රැකියා ආධාර ලබාදීමේ වැඩසටහන

එක්සත් ජාතීන්ගේ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 27 වන ව්‍යවස්ථාව මගින් ආබාධ සහිත තැනැත්තන්ට අන්‍යයන් සමග සමාන පදනමින් යුතුව වැඩ කිරීමට ඇති අයිතිය පිළිගනී. මෙයට ස්වයං රැකියා සඳහා අවස්ථා ප්‍රවර්ධනය කිරීමද ඇතුළත්වේ. ඒ අනුව ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ අරමුණෙන් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය මඟින් ආබාධ සහිත තැනැත්තන්ට හෝ ඔවුන් වෙනුවෙන් පවුලේ වෙනත් පුද්ගලයකුට ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා හෝ දැනට කරගෙන යන ස්වයං රැකියාව වැඩි දියුණු කර ගැනීම සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.25,000 ක උපරිම ආධාර මුදලක් ලබා දීමට කටයුතු කර තිබුණි. මෙම ආධාර මුදල් ලබාදීම ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් සමාජසේවා නිලධාරිගේ අධීක්ෂණය යටතේ සිදු වෙමින් පවතී.

කෙසේ වුවද ස්වයං රැකියාවක් ආරම්භ කිරීම සඳහා මෙම මුදලේ ප්‍රමාණවත්භාවය පිළිබඳ ගැටළු පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. ස්වයං රැකියා සඳහා ආධාර ලබාදීමේ ක්‍රම වේදයට අනුව 2016 වර්ෂයේ සිට 2019 සැප්තැම්බර් 30 දිනට ලබාදුන් ස්වයං රැකියා ආධාර පිළිබඳ තත්ත්වය පහත දැක්වේ .

| | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|
| ආධාර ලද පුද්ගල සංඛ්‍යාව | 389 | 421 | 412 | 285 |
| ගෙවූ ආධාර මුදල් රු. මිලියන | 9.3 | 9.9 | 10.0 | 7.03 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආබාධ සහිත පුද්ගලයින් ස්වයං රැකියාවක් සඳහා ආධාර ලබා ගැනීමට අයදුම්පත් යොමු කිරීමේ දී එම පුද්ගලයින්ගේ ආබාධිත බවට වඩා එම පුද්ගලයා කැමති විශේෂ නිපුණතාවයට අදාලවූ වෘත්තිය පුහුණුව ලබා දීමට කටයුතු කල යුතුවේ. මහ ලේකම් කාර්යාලය විසින් වාර්ෂිකව ආබාධ සහිත පුද්ගලයින් 300 ත් 400 ත් අතර පුද්ගලයින් සංඛ්‍යාවකට එක් පුද්ගලයකුට රු.25000 කට උපරිමයකට යටත්ව ස්වයං රැකියා ආධාර ලබාදී තිබුණි. එම පුද්ගලයන්ට අදාල ක්ෂේත්‍රය සඳහා විශේෂ පුහුණුවක් ලබා දීමට විදාතා වැනි විශේෂීකරණය වූ ආයතන සඳහා යොමු කිරීමට සමාජ සංවර්ධන නිලධාරීන් දැනුවත් කර තිබුණද එම නිලධාරීන් මගින් එම කාර්යය ඉටුවී නොතිබුණි. මේ හේතුවෙන් ලබාගත් ස්වයං රැකියා ආධාර මුදලින් ප්‍රමාණවත් ආදායමක් ඉපයීමට ඔවුන්ට නොහැකි ව තිබූ අවස්ථා නිරීක්ෂණය විය. උදාහරණ ලෙස එක් අවස්ථාවක

බිම්මල් වගාව සඳහා ස්වයං රැකියා ආධාර මුදල් ලබාගෙන ස්වයං රැකියා ආරම්භ කර තිබුණද බිම්මල් වගාවේ මූලිකාංග දැන සිටියද එය සාර්ථකව ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය දැනුම හා අවබෝධය වෙළඳ පොළ පිළිබඳ දැනුම ආදී කරුණු නොමැති කමින් එම ස්වයං රැකියාව ආසාර්ථක වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ආබාධිත පුද්ගලයාගේ ආබාධිත ස්වභාවය මත එම පුද්ගලයා තෝරාගන්නා ස්වයං රැකියාව කරගෙන යාමට හැකියාවක් තිබේද යන්න නිගමනය කර ආධාර මුදල ලබාදිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආබාධිත පුද්ගලයන් දෙදෙනෙකුට ස්වයං රැකියා කර ගෙන යාමට රු.25,000 ක් බැගින් 2018 වර්ෂයේදී ලබාදී තිබුණ ද එම ස්වයං රැකියා අතරමග නතරවී තිබුණි. එහෙත් ඒ සම්බන්ධව පසුවිපරම් කිරීමද සිදුවී නොතිබුණි.

(ඇ) ස්වයං රැකියා ආරම්භ කිරීමට පෙර ස්වයං රැකියාව ඉදිරියට කරගෙන යාම පිළිබඳ වෘත්තීය පුහුණුව මෙන්ම ආබාධ සහිත තැනැත්තන්ට අවශ්‍ය සහයෝගය පිළිබඳ සැලසුමක් සහ වෙළඳ පොළ පිළිබඳ තොරතුරු සහිතව නිවස මූලික කරගත් ප්‍රජා සංවර්ධන වැඩ සටහන් ලබාදීම කල යුතු වේ. නමුත් එවැනි මගපෙන්වීමක්, හා සහයෝගයක් ,බොහෝ අවස්ථාවලදී අදාල බලධාරීන් විසින් ආබාධිත ප්‍රජාව වෙත ලබා නොදීම හේතුවෙන් සහ ලබාදෙනු ලබන රු.25,000 ක් වූ ආධාර මුදල අපේක්ෂිත ස්වයං රැකියාව සඳහා ප්‍රමාණවත් නොවීම හේතු කොටගෙන ස්වයං රැකියාව ආරම්භ කල ද එය ආර්ථික වශයෙන් ඵලදායී ආකාරයට පවත්වා ගැනීමට නොහැකි වූ අවස්ථා නිරීක්ෂණය විය. උදාහරණ ලෙස නිම් ඇඳුම් කර්මාන්තය සඳහා මහන යන්ත්‍ර මිලදී ගත් බොහෝ ස්වයං රැකියා ලාභීන්ට මහන යන්ත්‍රය තිබුණද නූල්, රෙදි හා අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීමට ප්‍රමාණවත් මුදල් නොමැතිවීම. කොහු ආශ්‍රිත නිෂ්පාදන වල නිරත වන ස්වයං රැකියා ලාභීන්ගේ නිෂ්පාදන ආනයනික කෘත්‍රිම නිෂ්පාදන සමඟ තරඟ කල නොහැකි තත්වයකට පත් වි එම නිෂ්පාදන අලෙවිකර ගැනිමට අපහසු තත්ත්වයකට පත්ව තිබු අවස්ථා භෞතික පරීක්ෂවේදී නිරීක්ෂණය විය.

(ඈ) මෙම ආධාර ලබා දීමෙන් මාස 03 කට පසුව සහ වර්ෂයකට පසුව ස්වයං රැකියාවේ ප්‍රගතිය පරීක්ෂා කල යුතුය. මෙම ප්‍රගති වාර්තාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්ත සමාජ සේවා නිලධාරියා විසින් සිදු කල යුතුවේ. නමුත් ප්‍රගති වාර්තාව ලබා දීම මඟින් ආබාධිත පුද්ගලයා ස්වයං රැකියාව කරගෙන යන බවට තහවුරුවක් ලබා ගැනීම නැතහොත් පසුවිපරම් කටයුතු විධිමත්ව සිදු නොවන බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| විස්තරය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| ප්‍රතිපාදනය රු.මිලියන | 9.30 | 10.00 | 10.00 |
| වියදම රු.මිලියන | 9.29 | 9.98 | 10.05 |
| ස්වයං රැකියා ආධාර ලබාදෙන ලද පුද්ගල සංඛ්‍යාව | 386 | 422 | 412 |
| ප්‍රගතිය පිළිබඳ වාර්තා ලබානොදුන් සංඛ්‍යාව | 386 | 199 | 142 |

**3.2.3** ආධාරක උපකරණ ලබාදීම

ආබාධ ඇති තැනැත්තන්ට වඩාත් ස්වාධීන වීමට සහ සමාජය තුළ ඔවුන්ට සැරිසැරීම සඳහා හැකියාව ලබාදෙන විවිධ ආම්පන්න, උපකරණ, ආධාරක උපකරණවලට ඇතුලත්වේ. චලන ආබාධ ඇති පුද්ගලයන්ට ආධාරක උපකරණ වශයෙන් ත්‍රිරෝද බයිසිකල්, රෝද පුටු, අත්වාරු, කෘතීම අත්පා සහ වෙනත් ඇවිදීමේ උපකරණද, ශ්‍රවණ ආබාධ ඇති පුද්ගලයන්ට ශ්‍රවණාධාර උපකරණද, දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට කණ්නාඩි සහ සුදු සැරයටිද ලබාදිය යුතුවේ. සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ **2003** වර්ෂයේ ආබාධිත බව පිළිබඳව ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය යටතේ මෙම උපකරණ ලබාදීම වැඩිකිරීමේ උපාය මාර්ගයක් ලෙස ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමටත් **2014** ජනවාරි මාසයේ ඉදිරිපත් කරන ලද ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැළැස්මෙහි සෞඛ්‍ය හා පුනරුත්ථාපනය යටතේ මේ පිළිබඳ ඇතුළත් කර ඇත.

**2014** වර්ෂයේ සිට **2019** වර්ෂයේ ජූනි **30** දින දක්වා ආබාධ සහිත තැනැත්තන් සඳහාවූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් ආබාධිත පුද්ගලයනට ආධාරක උපකරණ ලබාදීම වෙනුවෙන් පහත සඳහන් පරිදි වියදම් දරා තිබුණි.

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 (ජූනි 30 දිනට) |
|---|---|---|---|---|---|---|
| දරන ලද වියදම රු.මිලියන | 29.76 | 10.11 | 13.54 | 14.13 | 13.03 | 2.32 |

මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් ආබාධිත පුද්ගලයන්ට ආධාරක උපකරණ ලබාදීමේ වැඩපිළිවෙල සඳහා හඳුනාගත් විධිමත් ක්‍රමවේදයක් පිළිබඳව සමාජ සේවා නිලධාරීන්ට මගපෙන්වීමක් වශයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ආධාරක උපකරණ ලබා ගැනීම සඳහා අවශ්‍යතාවය සහිත පුද්ගලයන් විධිමත්ව දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව හඳුනා ගෙන තිබුණද එම පුද්ගලයන්ට අවශ්‍යවන ආබාධිත උපකරණ හඳුනා ගෙන ඉල්ලුම් කිරීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. ඒ අනුව රෝදපුටු, කොමඩ් රෝද පුටු, වෝකර්ස්, අත්වාරු, කිහිලිකරු සහ ඇස් කණ්නාඩි (ළඟ පෙනෙන සහ දුර හා ළඟපෙනෙන ඇස් කන්නාඩි) ප්‍රමාණයන් කොතෙක්ද යන්න සළකා බැලීමක් සිදු නොකර මිළදී ගෙන එම උපකරණ දිස්ත්‍රික්කවල පවත්වන ලද ජංගම සේවාවලදී බෙදාහැරීමට කටයුතු කර තිබුණි. ජංගම සේවා පවත්වන ලද ස්ථානවලදී එම ආධාරක උපකරණ ලබාදුන් පුද්ගලයන්ගේ නාම ලේඛන ඉදිරිපත් කර තිබුණද, එම පුද්ගලයන් අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන්ද යන්න සහ එම නාම ලේඛණවල සඳහන් පුද්ගලයන්ටම ආධාරක උපකරණ ලබාදී තිබූ බවට කිසිදු තහවුරුවක් ලබා ගෙන නොතිබූ බව නිරීක්ෂණය වීය.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජීවත්වන අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන්ට ආධාරක උපකරණ අවශ්‍යව ඇතත් ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහලේකම් කාර්යාලය වෙතින්ම එම ආධාරක උපකරණ අදාළ කාර්යාල වෙත ගෙන්වා ගැනීමේ අපහසුතාවයන් ඇතිවිය හැකියැයි සමාජසේවා නිලධාරීන් විසින් උපකල්පනය කර උපකරණවල අවශතාවයක් ඇති ආබාධිත පුද්ගලයන්ට ඉල්ලුම් කිරීමට දැනුවත් කිරීමක් සිදු කර නොතිබූ අවස්ථා විගණනයට නිරීක්ෂණය විය. උදාහරණ ලෙස භෞතික විගණන පරීක්ෂාවේදී අනාවරණය කරගත් පරිදි ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇවිදීමට අපහසු ආබාධිත දරුවකුට කොමඩ් සහිත රෝද පුටුවක අවශ්‍යතාවය ඇතිබව ආබාධිත පුද්ගලයන් පිළිබඳව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එය ලබාගැනීමේ ක්‍රමවේදය සමාජසේවා නිලධාරියා එම අවස්ථාව වනවිටත් හඳුනාගෙන නොතිබුණි.

(ඈ) දෘශ්‍යාබාධිත පාසැල් දරුවන් සඳහා දුර හා ළඟ පෙනෙන ඇස්කණ්නාඩි බෙදාහැරීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබීම හේතුවෙන් පාසැල්වලට ඒ පිළිබඳව දැනුවත් කිරීම් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් වෛද්‍ය සහතික පදනම් කර ගෙන ඉල්ලුම් කළයුතු දුර හා ළඟ පෙනෙන ඇස්කණ්නාඩි වෛද්‍ය පරීක්ෂණයකින් පසු ලබාදීම පිළිබඳ දැනුවත් කිරීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබූ නිසා එම කණ්නාඩි සඳහා ඉල්ලුම අඩුවී තිබුණි. එසේම දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට ඇස්කණ්නාඩි ලබාදීමේදී ජංගම සේවාව පවත්වන ස්ථානයට පැමිණෙන ඕනෑම පුද්ගලයෙකුට ළඟපෙනෙන ඇස්කණ්නාඩි ලබාගත හැකිවේ. එවැනි කණ්නාඩි බෙදාහැරීම වෙනත් ස්වේච්ඡා ආයතනවලින්ද සිදුකරන බැවින් අඩු ආදායම්ලාභී ආබාධිතයන් වෙනුවෙන් වඩාත් ප්‍රතිඵලදායක සේවාවක් සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආයතනය විසින් ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. මෙම කණ්නාඩි ලබාගත් පුද්ගලයන්ටද පෙනීමේ යහපත් ප්‍රතිඵල නොලැබුණු බවද නිරීක්ෂණය විය.

(ඉ) වාර්ෂිකව මිළදීගෙන තිබූ ආබාධිත උපකරණ අදාළ වර්ෂය තුළදී බෙදා නොහැර ඉතිරිව පැවතිමක් නිරික්ෂණය වූ අතර, ඒවා බෙදාහැරීම සඳහා මාස 04 ක පමණ කාලයක් ගත කර

තිබූ බව නිරීක්ෂණය විය. ආබාධ සහිත තැනැත්තන් සඳහාවූ ජාතික මහලේකම් කාර්යාලය අබාධිතයින් විසින් ඉල්ලුම් කිරීමේ අවශ්‍යතාවය අනුව ආධාරක උපකරණ මිලදී නොගැනීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි. එසේම **2016** වර්ෂයේ සිට **2018** දක්වා ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය සේවය ගමට ගෙනයාමේ වැඩසටහන අනුව ආබාධිත උපකරණ ලබාදීම ක්‍රියාත්මක කර තිබුණද, එය **2018** පළමු මාස **02** න් පසුව නතරවීම හේතුවෙන් අවශ්‍යතාවයන් පවතින ආබාධසහිත පුද්ගලයින් සොයා ගෙන ඔවුන්ට සහනයක් ලබා දීම සඳහා ආධාර ක්‍රමය කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීම සිදුකර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ඊ) ආබාධිත සහිත තැනැත්තන්ට පරිත්‍යාග වශයෙන් ලබාදීමට විදේශ රටවලින් ශ්‍රී ලංකාවට ගෙන්වන ආධාරක උපකරණ තීරුබදුවලින් නිදහස් කර ගැනීමේ ක්‍රමවේදයක් මහා භාණ්ඩාගාරය විසින් සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශයට ලබාදී තිබුණි. ඒ අනුව සිංගප්පූරු සමාජ සත්කාරක ආයතනයක් විසින් මෙම අමාත්‍යාංශය වෙතින් එම තීරු බදු සහනය ලබා ගෙන ආබාධිත පුද්ගලයන්ට බෙදාදීම සඳහා ආධාරක උපකරණ පරිත්‍යාග කර තිබුණි. එහෙත් එම උපකරණ ආබාධිත මහ ලේකම් කාර්යාලයේ නිර්දේශ මත ආබාධිත පුද්ගලයින්ට බෙදා දී ඇති බවට තහවුරු කිරීම් ඉදිරිපත් නොවීය.

(උ) **2015** අයවැය යෝජනා අනුව අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන් සඳහා රු.**3,000** ක ජීවනාධාර දීමනාවක් ගෙවීමට අනුමත කර තිබුණි. ඒ අනුව **2015** සිට **2018** දක්වා ගෙවන ලද ආබාධිත දීමනා පහත පරිදි දැක්වේ.

| | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| ප්‍රතිපාදනය රු.මිලියන | 935.9 | 1,077.6 | 1,103 | 1,151. 7 |
| වියදම රු.මිලියන | 1,167.1 | 1,074.4 | 1,082 | 1,150 |
| පුද්ගල සංඛ්‍යාව | 32,422 | 30,005 | 30,077 | 31,956 |
| ඉතිරිය රු.මිලියන | නැත | 3.2 | 20.7 | 10.5 |

**2015** වර්ෂයේ සිට **2018** වර්ෂය දක්වා රු.**3,000** ක් වූ ආබාධිත දීමනාව ලබාදීමේදී වාර්ෂිකව ප්‍රතිපාදනය වැඩිවුවද, ආධාර ලබාදෙන පුද්ගල සංඛ්‍යාවේ වැඩිවීමක් නිරීක්ෂණය නොවීය. තවද ප්‍රතිපාදන ඉතිරිවීමක්ද නිරීක්ෂණය විය. ආබාධිත පුද්ගලයන්ගේ ආබාධිතභාවය විෂය කොටගත් දත්ත ජාතික, පළාත්, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය මට්ටමින් රැස්කිරීම, වාර්තාකිරීම සහ භාවිතා කිරීම නිසි පරිදි සිදු නොකිරීමත් ඉවත්වන ප්‍රතිලාභියාට නව ප්‍රතිලාභියකු නම් කිරීම ප්‍රමාදවීමත් මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

### 3.2.4 අධ්‍යාපනය සම්බන්ධයෙන් කෙරෙන අනුග්‍රහයන්

(අ) ආබාධිත මහ ලේකම් කාර්යාලය විසින් ආබාධ සහිත තැනැත්තන්ගේ අධ්‍යාපනයට පහසුකම් සැළසීම සඳහා ඔවුන්ට සාධාරණ ඉඩකඩ සහ සාධාරණ අවස්ථා හා පුද්ගල ආධාරක සේවා සැපයීම සිදු කරයි. මේ අනුව අඩු ආදායම්ලාභී පවුලක පාසැල්යන වයසේ සිටින දරුවකුට වාර්ෂිකව රු.10,000 ක උපරිමයකට යටත්ව අධ්‍යාපන කටයුතු වෙනුවෙන් පාසැල් උපකරණ මිළදී ගැනීමට ආධාර ලබාදෙනු ලැබේ. ඒ අනුව 2015 වර්ෂයේ සිට ලබාදී ඇති ප්‍රතිලාභයන් පහත පරිදිවේ.

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 ජුනි 30 දිනට |
|---|---|---|---|---|---|
| ලබාදුන් මුදල රු.මිලියන | 1.77 | 3.12 | 3.59 | 3.95 | 3.24 |
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 255 | 377 | 528 | 560 | 378 |

(ආ) අධ්‍යාපන ආධාර ලබාදීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින ආබාධිත දරුවන් සංඛ්‍යාව නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. ආධාර ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ඇතැම් අයදුම්පත්වල පවතින අඩුපාඩු හේතුවෙන් ඒවා ප්‍රතික්ෂේප කර තිබූ අතර එම අයදුම්පත් සම්බන්ධයෙන් නැවත සලකා බැලීමක් සිදුකර නොතිබුණි. එසේම අඩු ආදායම්ලාභි ආබාධිත පාසැල් දරුවන්ට මෙවැනි අධ්‍යාපන ආධාර ලබාදෙන බව පාසැල් මට්ටමින් දැනුවත් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් වයස අවුරුදු 16 සිට 35 දක්වාවූ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල නේවාසික පහසුකම් ලබාදී එම සිසුන්ට වර්ෂයක් හෝ වර්ෂ 02 ක වෘත්තීය පුහුණුවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 06 ක් පවත්නා අතර ළමයින් 400 ක් පමණ එක් වාරයකදී පුහුණු කටයුතුවල නිරතවේ. එසේම පුහුණුවෙන් පසුව යම් වෘත්තියක යෙදීමට කැමැත්තක් දක්වන සිසුන් රැකියාවලට යොමු කිරීම සහ ඒ සම්බන්ධව වරින්වර පසුවිපරම් කිරීමද සිදුකරනු ලැබේ. එසේම වෘත්තීය පුහුණුව ලබන කාල සීමාව තුළ සිසුන්ට දිනකට රු.150 බැගින්වූ මාසික දීමනාවක්ද එම සිසුන්ගේ ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කරනු ලැබේ. මෙම සිසුන්ට කාර්තුවකට නිල ඇඳුම් 02 ක් සහ සනීපාරක්ෂක උපකරණ පහසුකම් ලබාදෙන

අතර වාර්ෂික ක්‍රීඩා තරඟ පැවැත්වීම, කළා උළෙල පැවැත්වීම සහ වාර්ෂික විනෝද චාරිකා ගෙනයෑම සිදු කරනු ලැබේ.

එසේම රැකියා සොයන්නන්ගේ ලේඛණයක් මෙම ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අතර එමගින් සේවා යෝජකයන් සහ අයදුම්කරුවන් අතර සබඳතාවයක් පවත්වා ගැනීමට කටයුතු කරයි. ඇඳුම් මැසීම, වායුසමීකරණ අලුත්වැඩියා, ශීතකරණ අලුත්වැඩියා, විදුලි කාර්මික පුහුණුව, පින්තාරුවැඩ, බතික් කර්මාන්තය, අත්යන්ත්‍ර රෙදිවිවීම, වඩු කර්මාන්තය, පෙදරේරු වැඩ සහ පරිගණක පුහුණුව යන පාඨමාලාවලට නේවාසික පුහුණුව ලබාදී රැකියා ඉඩ ප්‍රස්ථා සැළසීම මගින් බොහෝ දුරට සාර්ථකත්වයක් ලබා ගෙන තිබුණි. එසේම වේවැල්වැඩ සහ කොහුවැඩ සඳහා වැටුප් ගෙවන රැකියා සොයා ගැනීම අපහසු බැවින් එම පුද්ගලයනට රු.15,000 ක් වටිනා ආයුධ කට්ටලයක් ලබාදී ස්වයං රැකියාවකට යොමු කරනු ලැබේ. කෙසේ වුවද පුහුණුව අවසන් වනවාත් සමඟම මෙම උපකරණ කට්ටලය ලබාදී නොතිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතරම මේ සම්බන්ධයෙන් සමාජ සේවා නිලධාරින් විසින් පසු විපරම් කටයුතු සිදුකිරීම ද ප්‍රමාණවත්ව සිදුකර නොතිබුණි.

### 3.2.5 ප්‍රවේශ පහසුකම් හා තොරතුරු සන්නිවේදනයට ප්‍රවේශවීමේ අවස්ථා

(අ) 2006 ඔක්තෝබර් 17 දින හා අංක 1467/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අදාළ භෞතික ප්‍රවේශය පිළිබඳ නීතිරෙගුලාසි බලාත්මක කිරීම සහ එම රෙගුලාසිවල දක්වා ඇති සම්මතයන් සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම, එවැනි රෙගුලාසි පිළි නොපදින රජයේ ගොඩනැගිලි හිමිකරුවන්ට එරෙහිව පැමිණිලි කිරීම සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතුය. නමුත් මෙම නීති රෙගුලාසි බලාත්මක කර ගැනීමට මෙන්ම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකිවී ඇත. ගොඩනැගිලිවලට පමණක් නොව බොහෝ මහාමාර්ග සහ පොදු ප්‍රවාහන පද්ධතිය තුලද ප්‍රවේශවීමේ අවම ප්‍රමිතීන් ඇතිකර ක්‍රියාත්මක කිරීම මන්දගාමී ස්වරූපයෙන් සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) සංඥා භාෂණ පරිවර්තනය සඳහා ජාතික සහතික පත් වැඩ සටහනක් සකස් කිරීම සිදුකල යුතුය. ඒ අනුව අඩු ආදායම් ලබන සමෘද්ධි පවුල්වල අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති දරුවන් 50 දෙනෙකු තෝරා ගෙන ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙතින් මාස 06 ක සංඥා භාෂණ පරිවර්තකයන් ලෙස ඩිප්ලෝමා පාඨමාලාවක් සකස් කර පුහුණුවීම් ලබාදී තිබුණි. එහෙත් එම පුහුණුවෙන් පසුව සහතිකපත් ලබාදී තිබුණු නමුත් පසුව රාජ්‍ය ආයතනවලට බඳවා ගැනීමට කටයුතු

කර නොතිබුණි. 2019 වර්ෂය වනවිට රාජ්‍ය අංශයේ සංඥා භාෂණ පරිවර්තකයන් ලෙස නිලධාරීන් 06 දෙනෙකු පමණක් සිටින බැව් නිරීක්ෂණය විය.

## 3.3 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙනුවෙන් ක්‍රියාත්මක වැඩ සටහන්වල කාර්යසාධන මට්ටම

### 3.3.1 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය සමස්ථ අවශ්‍යතා පිළිබඳ හා එම අවශ්‍යතා සම්පූර්ණ කිරිමට කටයුතු කිරීම.

අඩු ආදායම්ලාභී විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සවිබලගැන්වීම සඳහා ඔවුන් වෙත ලබාදිය යුතු අවශ්‍යතා සමස්ථයක් වශයෙන් හඳුනාගැනීමක් සිදුකිරීමට වැඩපිළිවෙලක් මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.. එනම් ආබාධ සහිත පුද්ගලයකුගේ ඉල්ලීම මත පමණක් සහන සැළසීම සිදුකරන අතර ඔවුන් පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදුකර ඔවුන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍යවන සහනයන් මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි. උදා; ආබාධිත දීමනාව ලබාගන්නා ආබාධිතයකුට ඇවිදීමේ අපහසුතාවය ඇත්නම් රෝද පුටුවක්, අත්වාරුවක් හෝ කිහිළිකරුවක් ලබාදීමේ අවශ්‍යතාවය පිළිබඳ සොයා බැලීම් සිදුකර නොතිබුණි.

### 3.3.2 අදාළ ආයතනික සේවාව විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් වෙත ළඟාවීම

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ වගකීම ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය සහ සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි. මෙම ආයතනවල සේවාව ලබාදීම සඳහා සියළුම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල අනුයුක්ත්ත කර ඇති සමාජසේවා නිලධාරියා තමාට අයත් ග්‍රාම සේවා වසම්වල ග්‍රාම නිලධාරියා මගින් දැනුවත්කිරීම් සිදුකරනු ලැබේ. ඒ අනුව සමාජසේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවලට ආබාධ සහිත ළමයින් ඇතුළත්කර ගැනීමට හැකියාව ලැබේ. එහෙත් මෙම ආයතනික සේවාවන් පිළිබඳව අවශ්‍යතාවයන් සහිත පුද්ගලයන් දැනුවත් වීම ප්‍රමාණවත් පරිදි සිදු නොවන බව භෞතික පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.

### 3.3.3 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සාක්ෂරතාවය සහ නිරෝගීකම

පාසැල් අධ්‍යාපනය ලබා ඇති ආබාධ සහිත වැඩිහිටියන් සහ උසස් සහ නොවිධිමත් අධ්‍යාපනයක් ලබා ඇති ආබාධ සහිත වැඩිහිටියන්ගේ අධ්‍යාපන මට්ටම ආබාධය අනුව 2003 දී මෙම අමාත්‍යාංශය විසින් සමීක්ෂණයක් සිදු කර වර්ෂ 16 ගතව ඇතත් ඒ සඳහා දත්ත යාවත්කාලීන කර ගෙන නොතිබුණි. වර්තමානය වනවිටද ආබාධ සහිත පාසැල් යන

වයසේ දරුවන් සම්බන්ධව අධ්‍යාපනයක් සහ වෘත්තීය පුහුණුවක් ලබාදීමට දෙමව්පියන්ගේ කැමැත්ත වැඩිවී ඇතිබව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවලට එවැනි ළමයින් ඇතුළත් කර ගැනීමේ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ආබාධ සහිත පුද්ගලයන්ගේ නිරෝගීකම සම්බන්ධයෙන් සම්පූර්ණ දායකත්වය ලබාදීමට සැළසුම්කර ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයටය. එහෙත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුයුක්ත සමාජසේවා නිලධාරීන් විසින්ද ජංගම සේවා පවත්වන අවස්ථාවල සෞඛ්‍ය සායනවලටද මෙම පුද්ගලයන් යොමු කරන බව නිරීක්ෂණය විය.

**3.3.4 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සමාජීය හෝ ජාතික ප්‍රතිපත්තියට අනුගත වීම**

රැකිරක්ෂා හා කම්කරු අමාත්‍යවරයා විසින් 2002 මැයි මස 01 දින නිකුත්කරන ලද රැකී රක්ෂා හා කම්කරු අමාත්‍යාංශයේ ජාතික රැකියා ප්‍රතිපත්තිය පිළිබඳ කෙටුම්පතට මෙම ආබාධ සහිත පුද්ගලයන්ද ඇතුළත්ව ඔවුන්ද සුදුසු රැකියාවක් ලබාගැනීම, තබාගැනීම සහ දියුණු කර ගැනීමට එම පුද්ගලයන්ට පහසුකම් සැළසීම සඳහා ඔවුන්ගේ දැනුම සහ නිපුණතා ඉහළ නැංවීම සඳහා රජය විසින් අවස්ථා ලබාදීමත් එම පුද්ගලයන්ට සමාජයට සම්බන්ධවී ආර්ථික ජීවිතයට ඇතුල්වීමට රජය විසින් හැකියාව ලබාදීමට කටයුතු කරන බව ඇතුලත් කර ඇත. ඒ අනුව වෙනත් රැකියා සොයන්නන් සමඟ ආබාධ සහිත තැනැත්තන්ට ද රැකියාජාල මධ්‍යස්ථානයක ලියාපදිංචි විය හැකිය. මෙයින් සිදුවන්නේ නිපුණතා ඇගයීමේ සහ සංවර්ධනය සඳහා මගපෙන්වීමේ සහ ඉන් පසු ස්වයංරැකියා විවෘත කරදීමේ ක්‍රියාවලියකි. ස්වයංරැකියා පවත්වාගෙන යාමට මූල්‍ය සහ තාක්ෂණික පහසුකම් ලබාදීම සහ ව්‍යාපෘති වර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ ලබාදීමද සිදුකරනු ලැබේ. මෙවැනි තත්වයන් ආබාධ සහිත පුද්ගලයන්ට ලබාදී ඔවුන් ධෛර්යමත් කිරීමක් පසුවිපරම් සිදුකිරීමත් මගින් ආබාධ සහිත පුද්ගලයාද රටේ ජාතික ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට දායකත්වයක් ලබා දීමට සුදුසු පුද්ගලයකු බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතු බව නිරීක්ෂණය වේ.

## 4. නිර්දේශ

**4.1** ශ්‍රී ලංකාවේ අඩු ආදායම් ලබන ආබාධිත පුද්ගලයන් සම්බන්ධයෙන් වර්ගීකරණය කළ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම සිදු කළ යුතු බව.

**4.2** ආබාධිත සභාව මඟින් ආධාර ලාභියාට ලබා දෙනු ලබන ආධාර මුදලින් වැඩ නිම කල හැකි ආකාරයේ ප්‍රමිතිගත නිවසක ආකෘතියක් යටතේ නිවාසයක් ඉදිකරගැනිමේ ක්‍රමවේදයක් ආධාරලාභියාට හඳුන්වා දිමට කටයුතු කළ යුතු බව.

**4.3** නව නිවාස ඉදි කිරීම් සඳහා ලබාදෙනු ලබන අයදුම්පත්‍ර ඇගයිමේ දී ආබාධ සහිත තැනැත්තාට ඉඩමක අයිතිය සතුව පවතිද යන්න විධිමත්ව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු බව හා ඉඩම් අහිමි ආබාධ සහිත තැනැත්තන් පිළිබඳව ද නිවාස ලබාදීමට සුදුසු වැඩ පිළිවෙලෙක් ක්‍රියාත්මක කල යුතු බව.

**4.4** නිවාස ආධාරය ලබාදෙන කාල සීමාවත් නිවාසය ඉදිකර අවසන් කිරිමට බලාපොරොත්තුවන කාලසීමාවත් පිළිබඳව ආධාරලාභීන් දැනුවත් කළ යුතු බව.

**4.5** සමාජ සේවා නිලධාරි විසින් නිවාස ඉදිකිරීම් සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර නිවාස අඛණ්ඩව ඉදිකරගෙන යාමට හැකිවන ආකාරයට ආධාරලාභියා නිවස ඉදිකිරීම සඳහා උනන්දු කරවිම හා ආධාර මුදලේ වාරික ප්‍රමාදයකින් තොරව ලබා දීමටත්, නිවාසය ඉදිකිරීම අවසන්වූ පසුව අප්‍රමාදව ප්‍රගතිය මහ ලේකම් කාර්යාලයට දැනුවත් කිරීමත් සිදු කල යුතු බව.

**4.6** ස්වයං රැකියා ආධාර ලබාදීමේදී ආබාධිත පුද්ගලයා හෝ එහි නිරතවීමට බලාපොරොත්තුවන එම පවුලේ සාමාජිකයාට ඉල්ලුම් කරනු ලබන ස්වයංරැකියාවේ නිරතවීමට ඇති නිපුණතාවය පිළිබඳව නිගමනයකට එළඹිය යුතු බව.

**4.7** ස්වයං රැකියාව සම්බන්ධව අවශ්‍ය කරන වෘත්තීයමය පුහුණුවක් ලබාදිය යුතු බව.

**4.8** ස්වයං රැකියාව කරගෙන යාමේදී පසුවිපරම් සිදු කිරීම සහ ඒ සම්බන්ධ ප්‍රගති වාර්තා මහ ලේකම් කාර්යාලයට අප්‍රමාදව ඉදිරිපත් කළ යුතු බව.

4.9 ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන් සොයා බලා විවිධ ආම්පන්න, උපකරණ ආධාරක උපකරණ ලබාදිය යුතු බව .

4.10 වැඩිහිටි ප්‍රජාවට ඇස් පරීක්ෂා කිරීමේ සායනයන්ට යොමුකර ප්‍රමිතියට අනුව ඇස් කණ්ණාඩි ලබා දිය යුතු බව

4.11 ආබාධිත සිසුන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම සත් වසරකට පමණක් සීමා නොකල යුතු බව

4.12 අධ්‍යාපන ආධාර ලබාදීම පාසැල් මට්ටමින් දැනුවත් කල යුතු බව

4.13 ආබාධිත පුද්ගලයන්ගේ අවශ්‍යතා හැකි උපරිම අයුරින් සම්පූර්ණ වන ලෙස සංවිධානාත්මක වැඩ සටහන් සකස් කිරීමට ප්‍රමාණවත් ස්ථිර කාර්ය මණ්ඩලයක් පත්කර ගත යුතු බව.

4.14 සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම සංඥා භාෂා නිලධාරියකුගේ සේවය ලබාදීමෙන් ආබාධ සහිත පුද්ගලයන්ගේ තොරතුරු සන්නිවේදනය විධිමත්ව පවත්වාගෙන යාමට හැකියාවක් ඇති කර ගත යුතු බව

4.15 අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැන්තතන් වැඩි ප්‍රමාණයකට එකවර සහන සැලසිය හැකි වන පරිදි වාර්ෂික අයවැය ලේඛණය මගින් වැඩියෙන් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු බව.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

2020 ඔක්තෝබර් දින

ඇමුණුම 1

**1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 12වන වගන්තිය අනුව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට, අභිසංවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට වග බලා ගැනීම සභාවේ ප්‍රධාන කර්තව්‍ය වන්නේය. 13 වන වගන්තියේ අනෙකුත් කර්තව්‍යයන් 22 ක් දක්වා ඇත.**

**(අ)** ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභසාධන ප්‍රවර්ධන කිරිම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සහ අභිසංවර්ධනය කිරිම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම.

**(ආ)** ආදාල ආමාත්‍යාංශ, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශිය මහලේකම් කාර්යාල , රාජ්‍ය හා පුද්ගලික අංශ සහ සංවිධාන විමසා, ආබාධ සහිත තැනැත්තන්ගේ අර්ථ සිද්ධිය හා අයිතිවාසිකම් වැඩිදියුණු කිරිම සහ ආරක්ෂා කිරිම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනිම.

**(ඇ)** ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභසාධන ප්‍රවර්ධන කිරිම සහ ඔවුන් ආරක්ෂා කිරිම සදහා වු යෝජනා ක්‍රම නිර්දේශ කිරිම.

**(ඈ)** ආබාධ සහිත තැනැත්තන්ගේ ශුභසාධන ප්‍රවර්ධන කිරිම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම මූලාරම්භය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**(ඉ)** ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වු අදාල ජාත්‍යයන්තර ප්‍රකාශන සහ සම්මුති ආණ්ඩුව විසින් පිළිගනු ලබන බවට සහ අනුගමනය කරනු ලබන බවට වගබලා ගැනිම.

**(ඊ)** ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගතහැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාම.

(උ) ආබාධ වලට ප්‍රධාන හේතු මොණවාදැයි සොයා දැන ගැනිම සහ ඒවා වැලැක්විමේ හා පාලනය කිරිමේ ඵලදායි පියවර ප්‍රවර්ධනය කිරිම.

(ඌ) ආබාධ සහිත තැනැත්තන්ගේ පුනරුත්තාපනය කිරිම සඳහා ගත යුතු පියවර සකස් කොට ඒවා ප්‍රවර්ධනය කිරිම.

(ඒ) ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් ඇති කිරිමට වගබලා ගැනිම.

(ඔ) ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සපුරාලන බවට වග බලා ගැනිම.

(ඕ) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සලසා ඔවුන් රැකබලා ගැනිම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට ආධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දිම.

(ක) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීම් පහසුකම් සැපයීමේ ආයතන පිහිටුවිම සහ එවැනි තැනැත්තන්ට ආධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දිමට රජය සහ පුද්ගලයන් දිරිමත් කිරිම.

(ග) ආබාධ සහිත තැනැත්තන් රැකබලා ගැනිම සඳහා පිහිටුවන ලද ආයතන වල කටයුතු සඳහා මග පෙන්විම, ඒවාට සහය දිම, ඒ කටයුතු සම්බන්ධිකරණය කිරිම සහ අධික්ෂණය කිරිම.

(ච) සියලුම කටයුතු වලට සම්පූර්ණයෙන් සහභාගි විමට ආබාධ සහිත තැනැත්තන් දිරිමත් කිරිම සහ ඒ සඳහා ඔවුන්ට පහසුකම් සැපයීම.

(ජ) ආබාධ සහිත තැනැත්තන්ට පිවිසිය හැකි සේ භෞතික පරිසරය සකස් කිරිමේ වැඩ පිළිවෙළවල් හඳුන්වා දිම සහ තොරතුරු ලබා දිමට සහ සන්නිවේදනයට ප්‍රවේශය ආබාධ සහිත තැනැත්තන්ට ලබා ගත හැකි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරිම.

(ට) ආබාධ සහිත තැනැත්තන් ගේ තත්ත්වය නංවාලීම සඳහා ආණ්ඩුව විසින් සහ ස්වේච්ඡා සංවිධාන සහ පුද්ගල මණ්ඩල විසින් සකස් කරන ලද මුලාරම්භ කරන ලද සහ ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙල සහ යෝජනා ක්‍රම අධික්ෂණය කිරිම

සහ සම්බන්ධිකරණය කිරිම සහ එවැනි කාර්ය සඳහා ප්‍රදාන ලබා දිම හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරිම.

(ඩ) ප්‍රකාශන පළ කිරිමෙන් සහ වෙනත් වැඩ පිළිවෙලවල් මඟින් ආබාධ සහිත තැනැත්තන්ගේ තත්ත්වය සහ අවශ්‍යතා පිළිබඳව මහජනයා දැනුවත් කිරිම.

(ණ) ආබාධ සහිත තැනැත්තන්ට සේවා සැපයීමේ නිරතව සිටින සංවිධාන වලට ප්‍රදාන මඟින් හෝ අන්‍යාකාරයකින් සහය දිම.

(ත) ආදායම් ලැබෙන සේවා නියුක්තිවල යෙදීමට ,ආබාධ සහිත තැනැත්තන්ට හැකි සෑම විටම සහය දිම.

(ද) ආබාධ සහිත තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරිමේ ක්‍රම පිළිබඳව අධ්‍යයන සහ පර්යේෂණ සඳහා ධෛර්ය දිම හා සියළු ක්‍රියාකාරකම් විෂයෙහිලා ඔවුන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරිම.

(න) ඉහත සඳහන් කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කිරිම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරිම.

ඇමුණුම 2

**පරීක්ෂා සිදු කළ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 හි අඩු ආදායම් ලාභී ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ග්‍රාමසේවා වසම් සංඛ්‍යාව | විගණිත දින වන විට අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගල සංඛ්‍යාව |
|---|---|---|---|
| කොළඹ | හංවැල්ල | **68** | **700** |
| | පාදුක්ක | **46** | **196** |

| | | | |
|---|---|---|---|
| | හෝමාගම | **81** | **910** |
| | කැස්බෑව | **73** | **540** |
| කළුතර | ඉංගිරිය | **31** | **590** |
| | වල්ලාවිට | **60** | **400** |
| | අගලවත්ත | **34** | **400** |
| කෑගල්ල | කෑගල්ල | **64** | **601** |
| | මාවනැල්ල | **71** | **551** |
| ගාල්ල | අම්බලන්ගොඩ | **36** | **476** |
| | ඇල්පිටිය | **51** | **536** |
| මහනුවර | පූජා පිටිය | **67** | **644** |
| | පහත හේවාහැට | **73** | **519** |
| | | | -------- |
| | | | **7065** |
| | | | ======= |

ඇමුණුම **03**

නිවාස ඉදිකිරීම් වල ප්‍රගතිය එවා නොතිබූ අවස්ථා

| වර්ෂය | ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව | ගෙවා අවසන් නිවාස සංඛ්‍යාව | ඉදිකිරීම් ප්‍රගතිය නොමැතිවූ නිවාස සංඛ්‍යාව |
|---|---|---|---|

| ……………... | ……………… | …………… | …………………... |
|---|---|---|---|
| **2014** | **96** | **67** | **53** |
| **2015** | **80** | **58** | **43** |
| **2016** | **283** | **193** | **134** |
| **2017** | **71** | **33** | **25** |
| **2018** | **40** | **06** | **06** |
| | ---------------- | --------------- | --------------- |
| **එකතුව** | **570** | **357** | **251** |
| | ===== | ====== | ====== |

**ඇමුණුම 04**

**2014 සිට 2019 (ජුනි 30 දක්වා ) වාරික ගෙවීමට ඇති නිවාස**

**------------------------------------------------------------------**

| | දිස්ත්‍රික්කය | නිවාස සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| 1 | කළුතර | 15 | 1,400,000 |
| 2 | මාතලේ | 6 | 400,000 |
| 3 | හම්බන්තොට | 8 | 900,000 |
| 4 | පුත්තලම | 14 | 620,000 |
| 5 | මුලතිව් | 5 | 750,000 |
| 6 | කොළඹ | 20 | 2,180,000 |
| 7 | ගම්පහ | 23 | 2,000,000 |
| 8 | ගාල්ල | 9 | 940,000 |
| 9 | මොණරාගල | 7 | 530,000 |
| 10 | වවුනියාව | 1 | 500,000 |
| 11 | අම්පාර | 9 | 940,000 |
| 12 | අනුරාධපුරය | 6 | 490,000 |
| 13 | රත්නපුර | 14 | 1,159,814 |
| 14 | නුවරඑළිය | 2 | 250,000 |
| 15 | පොළොන්නරුව | 14 | 1,000,000 |
| 16 | කුරුණෑගල | 27 | 2,600,000 |
| 17 | මහනුවර | 4 | 582,586 |
| 18 | බදුල්ල | 5 | 450,000 |
| 19 | මාතර | 7 | 850,000 |
| 20 | මඩකළපුව | 10 | 1,000,000 |
| 21 | යාපනය | 03 | 350,000 |
| 22 | ත්‍රිකුණාමලය | 10 | 750,000 |
| | එකතුව | 219 | 20,642,400 |

**ඇමුණුම 05**

**මුදල් ලබා දී තිබුණද නිවාස ඉදිකිරීම නතර කර තිබූ අවස්ථා**

-----------------------------------------------------------------

| | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ | ආරම්භ කළ වර්ෂය | නම | මුදල | දැනට ලබා දී ඇති මුදල |
|---|---|---|---|---|---|---|
| | - | | | | රු | රු. |
| 01. | අනුරාධපුරය | තඹුත්තේගම | 2014 | දණුසිත් මධුසංඛ | 230,000 | 200,000 |
| | | මහවිලච්චිය | 2015 | කේ.ගුණරත්න | 250,000 | 200,000 |
| 02. | අම්පාර | පදියතලාව | 2016 | එච්.එන් ප්‍රේමවතී | 250,000 | 100,000 |
| 03. | කළුතර | ඉංගිරිය | 2016 | එම්. ජිනදාස | 250,000 | 250,000 |
| 04. | කුරුණෑගල | ගනේවත්ත | 2015 | ඒ.පී. රංජිත් අසන්ත | 250,000 | 200,000 |
| | | ” | 2015 | පී.ජී.ආර්.නවරත්න | 250,000 | 200,000 |
| | | රිදීගම | 2016 | උපුල් සුමිත් | 250,000 | 100,000 |
| | | මාවතගම | 2016 | ලිනස් ජයසිංහ | 250,000 | 100,000 |
| | | ගනේවත්ත | 2016 | බී.නිමල් කුමාර | 250,000 | 75,000 |
| 05. | කොළඹ | මහරගම | 2016 | දුලාංජන රණසිංහ | 250,000 | 50,000 |
| 06. | ත්‍රිකුණාමලය | අඹගමුව | 2016 | බී.ජී.වික්‍රමරත්න | 250,000 | 150,000 |
| 07. | පොළොන්නරුව | හිගුරක්ගොඩ | 2016 | කේ.එම් සමරජීව | 250,000 | 200,000 |
| 08. | හම්බන්තොට | වලස්මුල්ල | 2016 | මධුර ධර්මසිරි | 250,000 | 100,000 |
| | එකතුව | | | | | 1,925,000 |

ඇමුණුම **06**

නිවාස ආධාර මුදල් ආපසු එවීම

-----------------------------------

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ආබාධිත පුද්ගලයාගේ නම සහ ලිපිනය | ආබාධිත බව | ලබාදුන් මුදල | දිනය | ආපසු එවූ මුදල සහ දිනය |
|---|---|---|---|---|---|---|
| | | | | රු. | | රු. |
| **01.**කුරුණෑගල | කුලියාපිටිය බටහිර | ආර්.එම් චන්ද්‍රා කුමාරි, මාං හිමි පිටිය,තල හිටිමුල්ල | මනස වර්ධනය මන්දගාමී | **100,000** | **2014.05.30** | **100,000 2016.02.05** |
| - | උඩුබද්දාව | ඒ.එම්.ජී අත්තනායක කිඹුල්තොට මුල්ල,වැලි පැත්ත ගහ මුල්ල | සුසුම්නා ආබාධ | **100,000** | **2014.05.30** | **100,000 2016.02.05** |
| - | කුලියාපිටිය බටහිර | කේ.ඒ.ඩී.කරුනායක | චලන ආබාධ | **100,000** | **2014.20.20** | **50,000 2015.04.30** |
| - | කඳුගම කොබෙයිගනේ | ඩබ්ලිව්.අයි.එච්.සාගරිකා ප්‍රියදර්ශනි | මන්ද මානසික | **100,000** | **2017.12.09** | **100,000 2018.09.19** |
| **02.**ගම්පහ | කටාන | පී.රූපවතී | මන්ද මානසික | **100,000 100,000** | **2016.03.17 2016.10.05** | **200,000** |
| **03.**පොළොන් නරුව | හිගුරක්ගොඩ | ඉසුරු ගුණතිලක | අපස්මාරය | **100,000** | **2014.08.28** | **100,000 2016.12.14** |
| **04.** මාතර | ගැමුණු කඳවුර | කුමුදු නන්ද ගුණසේකර | අංශභාගය | **100,000 150,000** | **2015.12.07** | **250,000 2016.06.07** |
| - | අතරලිය | එච්.නයනතාරා | ශ්‍රවන හා කථන ආබාධ | **100,000 150,000** | **2015.12.07** | **250,000 2016.09.13** |
| - | දෙවිනුවර | පී.බී.ආර්.චන්ද්‍ර කුමාර දෙවිනුවර ගලගනේ පාර,දෙවිනුවර | මානසික රෝගාබාධ | **100,000** | **2014.03.28** | **100,000 2016.10.20** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **05.** මහනුවර | තෙල්දෙණිය | ඩබ්ලිව්.ජී.ගුණදාස අංක **09** ගොඩ මවින් වැවේගම,රජ වැල්ල | මානසික ආබාධ | **100,000** | **2016.02.05** | **100,000** **2017.03.24** |
| **06.**මුලතිව් | වැලිඔය | එච්.පී.හේවා පතිරණ | මන්ද මානසික | **100,000** | **2015.02.08** | **100,000** **2017.06.21** |
| **07.**හම්බන් තොට | අම්බලන්තොට | ජී.ආර්.රංජිත් ප්‍රියන්ත,ගනේයාය පාර,රුහුණු රිදිගම | ශාරීරික ආබාධ | **100,000** | **2016.03.12** | **100,000** **2016.10.17** |
| **-** | වලස්මුල්ල | එම්.පී.මධුරංග,ධර්මසිරි අමිල පැතුම් තුම්මල් ගොඩ යහල් මුල්ල, වලස් මුල්ල | චලන ආබාධ | **100,000** | **2016.11.12** | **100,000** **2016.11.29** |
| | | | | | | **1650.000** |
| | | | | | | **=======** |

ඇමුණුම **7**

උතුරු නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක **08** ක නිවාස ආධාර ලබාදීම

| දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | එකතුව |
| --- | --- | --- | --- | --- | --- | --- |
| ------------- | --------- | --------- | ----------- | ---------- | --------- | |
| අම්පාර | 04 | 05 | 18 | 03 | 04 | 34 |
| ත්‍රිකුණාමලය | 06 | 07 | 05 | 02 | 01 | 21 |
| මඩකලපුව | 19 | 08 | 25 | - | 01 | 53 |
| මුලතිව් | 02 | - | - | - | - | 02 |
| මන්නාරම | - | 03 | 01 | - | - | 04 |
| යාපනය | 10 | 04 | 02 | - | 01 | 17 |
| | ---- | ---- | ---- | ----- | ----- | ----- |
| | 41 | 27 | 51 | 05 | 07 | 131 |
| | === | === | === | === | === | ==== |

කිලිනොච්චිය 2014 සිට 2018 දක්වා ලබාදී නැත

වවුනියාව එම